# සැඳෑව

சந்தாவ

ශ්‍රී ලංකා
මහ බැංකු විශ්‍රාමිකයන්ගේ
සංගමය
2016 ජුනි/ අගෝස්තු.



වෙබ් අඩවිය ඃ www.sendewa.org විද්‍යුත් ලිපිනය info@cbpa.com

අංක ඃ QD/83/News/2016 යටතේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදී.


## සාමූහික චාරිකා.......




**සං**තෘෂ්ඨිය හෙවත් සතුට අන්තර්ගත වූ ක්‍රියාවක් තමයි චාරිකාව හෙවත් සංචාරය කියන්නේ. සංචාරය දේශිය හා විදේශිය වශයෙන් අංශ දෙකයි. සංචාරය කියන්නේ සැරිසැරීම. දන්න හෝ නොදන්න පරිසරයන් තුළ සැරිසැරීම වින්දනීය මෙන්ම ආස්වාද ජනක අවස්ථාවක් බවට පත්වනවා. එවැනි ආශ්වාද ජනක අවස්ථා මඟින් ඊට සහභාගී වන පුද්ගලයින්ට මුලින්ම මානසික සුවයක් ලැබෙනවා. ආතතිය දුරු වෙනවා. ඒකාකාරී බව නිසා දැනෙන ඔලාරික තෝන්තුව දුරුව යනවා. ටික ටික සතුට මෝදුවෙනවා. ඉන් පස්සේ සතුටින් සිත උතුරා යනවා. ඒ සතුට මිල කරන්න අමාරුයි. ''සතුට පරම ධනය''යි කියන්නෙත් ඒකමයි. තනි තනිව චාරිකා කරනවාට වඩා පිරිසක් සමඟ චාරිකා වල යාම වඩා රසවත්. අපේ විශ්‍රාමික සංගමය වර්ෂයකට ඒ වගේ **සාමූහික චාරිකා** දෙකක් විදිනවා. ඒ තමයි එක් දින චාරිකාව හා තුන්දින චාරිකාව. (පසු ගිය තුන්දින චාරිකා වේ ශේෂයක් සඳහා 10 පිටුව බලන්න) ඒ අනුව නව වසරේ එක් දින චාරිකාවට දැන් කාලය ළඟා වෙමින් තියෙනවා.

**එක් දින චාරිකාව - 2016.**


ඔන්න ඉතිං නව වසරේ එක්දින චාරිකාව අගෝස්තු මාසේ 20 වෙනි සෙනසුරාදාට යොදාගෙන තියෙනවා. මේ එක් දින චාරිකාව පැවැත්වෙන්නේ පාදුක්ක පැත්තේ දර්ශනීය නිකේතනයකදීය. නව විධායක කමිටුවට මෙය පහසුවෙන් සංවිධානය කර ගැනීම සඳහා ඔබගේ පැමිණීම හා ඔබගේ දායකත්වය වෙනදා වගේම ගරු භාණ්ඩාගාරික ආර්.ඩී. ගුණසේන මහතාට දැනුම් දෙන්න. ප්‍රවාහන පහසුකම් හා ආහාර පාන සැපයීම පිළිබඳ කටයුතු සංවිධානය කර ගැනීම සඳහා කල්වේලා ඇතිව දායකවන්න. 2016 අගෝතු 10 දිනට පෙර චාරිකාවට සහභාගී වන ඔබගේ දායකත්වය සම්පූර්ණ කරනු ඇතැයි විධායක කමිටුව බලාපොරොත්තු වේ. **(වැඩිවිස්තර සඳහා 20, 21, 22, 23 පිටු කියවා බලන්න)**

## සාදරයෙන් පිළිගනිමු.



**WELCOME**











# වසර 60 කට පෙර එක් දින චාරිකාවක්....

**දි**නක හෝ දින කීපයක චාරිකාවක් සංවිධානය කරල කැඳවාගෙන යන්න තරම් කැප වූ සංවිධාන අද ඕන තරම් තියෙනවා. ඒ සංවිධාන විසින් දේශිය චාරිකා විතරක් නෙමෙයි විදේශ චාරිකා පවා සංවිධානය කරනවා. බොහෝ ආයතනවල විවිධ සේවාවන් කේන්ද්‍ර කර ගනිමින් විවිධ සංවිධාන තියෙනවා. මහ බැංකුව තුළත් මේ වන විට වෘත්තීය සංගම්, ආගමික සංගම්, සංස්කෘතික සංගම්, වගේම ක්‍රීඩා සංගම් පවා තියෙනවා. ඒ සංගම් මඟින් සමහර විට චාරිකා සංවිධානය කරලා යනවා. එහෙත් මහ බැංකුව ආරම්භ කළ වකවානුවල එහෙම සංගම් තිබුණේ නැහැ.

අද අපේ විශ්‍රාමික සංගමයේ ඉන්න ජ්‍යෙෂ්ඨ සාමාජිකයෝ අවුරුදු 60 කට විතර කලින් හොඳ හද්‍ර යෞවන වයසේ හිටිය කොල්ලො කෙල්ලෝ. තෙල් ඉහිරෙන, පොපියන, නළියන ක්‍රියාශීලී වකවානුව. ඒ කාලේ හැටියට විනෝද චාරිකාවක් සංවිධානය කිරීම අද වගේ ලේසි පහසු වැඩක් නෙමෙයි. අද වගේ එදා නවීන තාක්ෂණයක් හෝ උපකරණ හෝ යාන වාහන පහසුකම් තිබුණේ නැහැ.

ඒත් මම මගේ මිතුරු මිතුරියන් කිහිප දෙනෙකු එකතු කරගෙන එක් දිනක විනෝද චාරිකාවක් සංවිධානය කළා. අපි ගියේ ගම්පහ මල් වත්තට. එදා උදේ 08.00ට අපි පිටත් වුනේ කොළඹ කොටුව දුම්රිය ස්ථානයෙන්. අද වගේ ලවක් දෙවක් නැති දුම්රිය ප්‍රමාදයන් එදා තිබුණේ නෑ. අපි ගමන් ගත්ත කෝච්චිය උදේ 09.00ට විතර ගම්පහ දුම්රිය ස්ථානයට ළඟා වුනා. දුම්රිය පොලේ ඉඳලා ගම්පහ මල් වත්තට ගියේ පයින්. එදා සැතපුමක් හෝ ඊට වැඩියෙන් වුනත් පයින් යන එක එතරම් කජ්ජක් නෙමෙයි.

එදා ගම්පහ මල් වත්තේදී උදේ ඉඳලා හවස් වන තුරුම ඔන්චිලි පදිමින්, ක්‍රීඩා කරමින්, දුවමින්, පනිමින්, සිංදු කියමින්, විනෝද වුණා. සතුටු සිනා දෝර ගලා ගියා. එදා අපේ මිතුරියන් කීපදෙනෙකුම කුඩා කුඩා රස කෑම වර්ග ගෙනැල්ලා තිබුණේ බෙදා හදාගෙන කන්නමයි. එහෙම කනකොට රස වැඩියි කියලා හැමෝම කිවුවා. දවල් ආහාර වේල සහ සවස තේ පැන් සංග්‍රහය ලබා දුන්නේ ගම්පහ මල් වත්ත කිට්ටුවම පදිංචි වෙලා හිටපු මහ බැංකුවෙම කිහිපදෙනෙකුගෙ පෞද්ගලික අනුග්‍රහයෙන් බව මට තාම මතකයි. උතුරා පිටාර ගලන සතුටක් දවස පුරාම වින්ද අපි හවස 6.00ට විතර ආයෙමත් කොළඹට පය තිබ්බ. අවුරුදු 60කට විතර කලින් ගිය ඒ විනෝද චාරිකාව අදටත් මට සුවඳ දිදී දැනෙනව. එත් ඒ චාරිකාවට සහභාගී වූ සමහර මිතුරු මිතුරියන්ගේ නම් මට මතක්කර ගන්න අමාරුයි. ඒත් එදා ගත්ත ඡායාරූප කීපයක් කෞතුක වස්තුවක් වගේ මගේ ලග තියෙනව. 3 වෙනි පිටුවේ දැක්වෙන්නේ ඉන් කිහිපයක්. එදා හද්‍ර යෞවනයේ හිටපු මම වගේම **හෙන්රි මානවඩු, පීටර් රණවක,** B.R. **ඉමැනුවල්, එම්යානන්දන්, සෝමපාල හත්නාගොඩ, ආරියසේන පේදුරුවාහේව, ආනන්ද එස් ගුණරත්න, බර්ටි ජයසූරිය, එස්. කරුණාරත්න, ජී මුණසිංහ, ක්ලෙමන්ට් අලහකෝන්, සුමනා කරුණාරත්න, ශීලා රේගල්** කියන මිතුරු මිතුරියන්ගේ නම් තාම මතකයි.

තනි තනිව චාරිකාවල යනවාට වඩා, තමන්ගේ මිතුරු මිතුරියන් විශාල පිරිසක් එක්ක චාරිකාවක යෙදීම තව තවත් නිරෝගී වීමට හේතුවක්. වයස මුහුකුරා යද්දි නිරන්තරයෙන්ම හමුවන ආතතිය, කාන්සිය, උකටලීබව, කලකිරීම, සාංකාව, වගේ මානසික පරිවර්තනයන්ට හොඳම හොඳ ඖෂධයක් තමයි සාමූහික චාරිකා. පසුකාලීනව ඒ පිළිබඳ මතකයන් සම්භාව්‍ය ගණයේ සිනමා පටයක් වගේ අවලෝකනය වෙන එක රසයට උල්පතක් බව මගේ විශ්වාසය යි.



**එම්.ඩබ්.ඩී. සිල්වා (0358)**
**0112-792038**

**1**



හැටවසරකට පෙර අපි ගම්පහ දුම්රිය
නැවතුම්පලේ දී.....

**2**



වමේ සිට සුමනා කරුණාරත්න, නම අමතක
සොයුරිය, ශිලා රේගල්, පාපැදියේ සිටින
මුණසිංහ වාඩි වී එම් බී ඩී සිල්වා, එස්
කරුණාරත්න, ක්ලෙමන්ට් අලහකෝන්,
ආනන්ද එස් ගුණරත්න .....

**3**




වමේ සිට බී ආර් එමැනුවෙල්, නම අමතක
සොයුරිය, එම් බී ඩී සිල්වා, චිමියානන්දන්,
හෙන්රි මානවඩු

**4**



නම අමතක සොයුරියක් මල් ආරුක්කුව
ඉදිරිපිට දී.....

**5**



කා බී විනෝදවන පි ඩී රුද්‍රිගෝ බර්ට් ජයසූරිය
එම් බී ඩී සිල්වා සහ පීටර් රණවක..

**6**



දිවා ආහාර පාර්සල් බෙදන බී ආර්
ඉමැනුවෙල් .....

# පිළියන්දලිනුත් චාරිකාවක්........

**ම**හ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමයේ පිළියන්දල එකමුතුවේ අපි 2015 දෙසැම්බර් 18 වන දින එක් දින චාරිකාවක නියැලුනෙමු. බොහෝ ආශාවෙන් බලා සිටි එම චාරිකාව පාදුක්ක, බෝපේ, ප්‍රදේශයේ පිහිටි සෙරනිටි ලෙෂර් පාක් හොටෙල් බලා උදෑසන 8 පමණ පිළියන්දලින් පිටත්වීමු. එම ගමන් මාර්ගය ගමේ පරිසරය සහිත නිශ්කලංක පරිසරයක් විය. කවුරුත් ඉතා නිවුණු සිතින් ගමන් කරමින් එම ස්ථානයට ලඟා වීමු.වෙල් යායකින් ද දිය පහරවල් සහ කඳු වලින් වටවූ උස් පෙදෙසක පිහිටි එම ස්ථානය කාගෙත් සිත් ඇඳ බැඳ ගත්තේ එහි පැවති සිසිල හා සුන්දරත්වය නිසාය.

ගමේ පළතුරු පානයක රස බැලූ අපි එහි ඔබ මොබ ඇවිද පරිසරයේ සුන්දරත්වය විඳ ගතිමු. අප සමඟ ගිය පුතුන් සතර දෙනා පිහිනුම් තටාකයට බැස රිසි සේ විනෝද වූහ. අපේ සහෝදර සහෝදරියන් ගීත ගායනා කරමින් නටමින් විනෝදයෙන් සිටි අයුරු දුටු විට හැඟී ගියේ මොවුන් සැට පිරී විශ්‍රාම ගිය නමුත් කොහේ හෝ වරදක් සිදුවී ඇත්ද යන්නයි. එසේ සියළු ප්‍රශ්න, රාජකාරි ආදිය කර සෑහෙන වේලාවක් ගත වුවත් නොදැනීම දිවා ආහාර වේලාව ද පසු වීමට ආසන්න බැව් පෙනී ගිය බැවින් රසවත් දිවා භෝජනය භුක්ති විඳ තවත් සෑහෙන වේලාවක් කතා බහේ යෙදී සිට නිවෙස් බලා ඒමට පිටත් වීමු.



**හේමා විමලසෝම (646)**
**0112 614717.**

# මාලදිවයිනේ - ගිය ගමනේ - සබ්මැරීනේ - ඇති වරුණේ

**2015** ඔක්තොම්බර් 17 වැනි දින රාත්‍රියේ මමත් මගේ ස්වාමි පුරුෂයාත්, ජිනදාස මහතා සහ එම නෝනා මහත්මියත් මයානි ලංකාදේව සහ ආරි ප්‍රනාන්දු සෝවුරිනුත් දින තුනක සංචාරයක් සඳහා මාල දිවයිනට යෑමට පිටත් වූයෙමු. දින තුනක් කියා පැවසුණ ද එය රාත්‍රි දෙකකට පමණ සීමා වූයේ ය. මාලදිවයිනේ බලන්නට ඇත්තේ මොනවාදැ යි බොහෝ දෙනෙක් ඇසූහ. හුලුලේ ගුවන් තොටුපළට ළඟා වූ විට හා එහි සිට මුහුදේ අසිරිය හා කිරි සුදු වැල්ල දුටු විට එය ප්‍රලාපයක් බව සිතිණි.

අප නවතින්නට අපේක්ෂිත හුලුමාලේ දූපත් නවාතැනට යන අතරතුර මාලේ දූපත් ගැන මා කියවූ දේ ගැන මතකයට නැගිණි. බිම් මට්ටමේ සිට පහළින් ම පිහිටි ලොව දූපත් වලල්ල ඇත්තේ මාලදිවයිනේ ය. එහි කිසිදු කඳු ගැට්ටක් දකින්නට නැත. මාලයක් වැනි දූපත් සමූහයක් ඇති බැවින් මාලදිවයින යන නම යෙදිණි. මෙම දිවයිනෙහි වැසියන් ව්‍යවහාර කරන දිවෙහි බසෙහි බොහෝ වචන සිංහල වදන් වලට සමානය. එකේ සිට දහය දක්වා ගණින්නේ එකේ - දෙකේ - ආදී වශයෙන් දහේ දක්වා ය. මෙහි භාෂා රටාව දෙස බලන විට තවද පාළි, සංස්කෘත, හින්දි, දෙමළ ආදී භාෂා සමූහයක අභාසය ලැබී ඇත. දෙමළ බසින් **මාලෙයි තීව්** යැයි කියති. මහාවංශයේ **මහිලා දිවයින** යනුවෙන් ව්‍යවහාර වුව ද මාලය යන වදන ඇසුරින් එය නිෂ්පන්න විය හැකිය. සංස්කෘතියෙන් මාලා ද්වීපය. ඉබන් බතූතා මහල් දිවියාත් කියා කියූයේ ආරාබි බසින් නව මහල් යන්නෙන් බිඳී ආ වදන ඇසුරිනි. භාෂා විශාරදයෙකු වූ අරිසෙන් අහුබුදු මහතා කියන්නේ මාරේ (මුහුද යන පැරැණි

සිංහල වදන) දිවයින මාලේ දිවයින වූ බවය. මේ හැරෙන්නට මෙම දූපත් වල පළමු මිනිසුන් සිංහල අය බව කියති. විජය රජු කලදී නැවක් මහිලා ද්වීපයට පාවී ආ බව සඳහන් වෙයි. අසෝක රජු කල බුදු දහම එහි පැවැතිණි. පසුව මොරොක්කෝ වැසියෙකු වන අබු බරාකත් ද රේබර්ගෙන් පසු ඉස්ලාම් දහම මාලදිවයිනේ ප්‍රචලිත වූයේ ය. වර්තමානයේ දිවෙහි වැසියෝ සියලු දෙනාම ඉස්ලාම් දහම අදහති. දූපත් මාලයේ දෙදහසකට අධික දූපත් ඇති අතර ඉන් මිනිස් වාසයෙන් යුතු වන්නේ දෙසීයකට අධික සංඛ්‍යාවකි. (අප මග පෙන්වන්නාගේ දෙමාපියන් වසන තැනට යන්නට පැය දහයක් පමණ බෝට්ටුවෙන් ගමන් කළ යුතුය.)

අප ගමනේ විස්තර පළමු දා රෑ හුලුමාලේ වෙල්වට් බීච් හෝටලයේ ගත කළ අතර පසු දින උදැසනින් ම අපි මාලේ දූපතට යන්නට සූදානම් වීමු. අපේ මාර්ගෝපදේශක මූසා මහතා පහළ මහලේ පිහිටි පිළිගැනීමේ මේසය අසල දී කීවේ සබ්මැරීනයක් හෙවත් කුමුදුවකින් මුහුද යටට ගොසින් එහි අසිරිය බැලිය හැකි බවයි. අපි සියළුදෙනාම එම ගමන යන්නට එකඟත්වය පළ කළෙමු. (එක් අයෙකුට ඇමරිකන් ඩොලර් එකසිය විස්සක් අය කෙරේ.) හුලුමාලේ බෝට්ටු තොටුපළට ගොසින් මාලේ දූපතට යන්නට විශාල බෝට්ටුවකට හෙවත් ෆෙරි එකට නැංගෙමු. මෙම ෆෙරියේ මගීන් දෙසීයයකට පමණ පහසුවෙන් ගමන් කළ හැකියි. කිසිවෙකුට හිටගෙන යාමට ඉඩ නොලැබේ. හදිසියක දී භාවිත කරන්නට හැකිවන අන්දමින් ගුවන් යානවල මෙන් සීට් යට ලයිෆ් ජැකට් ඇත. මෙම ෆෙරියේ පිටුපස කොටස වෙන්වෙන්නේ මෝටර් සයිකල් ප්‍රවාහනයටයි. හුලුමාලේ සිට මාලේ දූපතට යන සමහරු මෝටර් සයිකලයෙන් තම අවශ්‍යතා සඳහා පිටත් වෙති. මූද මැද ඉතා අපූරු අත්දැකීමක් විය.

එයින් බැස වෙනත් බෝට්ටු අංගනයකට ගියේ මූද මැද සවිකර තිබූ සබ්මැරීන අංගනයට යෑම පිණිසයි. එයට මිනිත්තු දහයක් පමණ ගත විය.

සබ්මැරීනයට ඇතුලු වන විට අප සැමගේ සිත් ආශිර්වාදයකින් පිරී ගිය ද තරමක චකිතයට භාජන වූ බව රහසක් නොවේ. මෙය හදිසියේ ගිලුණෝතින් !!! දෙපැත්තටම අසුන් පනවා ගුවන් යානයක මෙන් පිටත බලන්නට හැකි ලෙස ආසන පනවා ඇත. මෙය තල් මසුන් නරඹන්නට නිම කළ යානයකි. ඇතුළත වායු සමීකරණය කර ඇත. නිල් පැහැයෙන් ආලෝකමත් කර තිබුණේ මුහුදේ යටට සරිලන පරිද්දෙනි. යානය පණගැන්වීමෙන් පසු කෙමෙන් කෙමෙන් මුහුදේ පත්ලට ළගා වූයේ ය. (එය මීටර් එතලිහක පත්ලට ගමන් කළ බව එහි සේවිකාවකගෙන් දැන ගන්නට හැකි විය.)

එක් ස්ථානයක දී යානය නවත්වා ස්ථාන ගත කළ විට විවිධ මාළු වර්ග අප වටා රොක් වූහ. කුමන හෝ ආකාරයකින් මාළුන්ට ආහාරය පිණිස මාළු සපයා තිබිණි. ඒවා බුදිමින් විවිධ අලංකාරවත් මාළු අපෙන් ද කෑම ඉල්ලනවාක් මෙන් වූයේ ය. යානය ඇතුලේ සිටි අප ඇතුළු විදේශකයින් තිහකට අධික නරඹන්නන් මුහුදේ යට අසිරියෙන් වශීකෘත ව සිටි බව දැනුණේ සෑමදෙනාගේම මුවින් පිටවුණු ආහ්ලාදජනක "හා හූ හෝ ස්" යන විවිධ හැගුම් ප්‍රකාශිතයන්ගෙනි. මුහුදු පත්ලේ විනාඩි හතළිහක පමණ සීමාවක් අපි රැදී සිටියෙමු. විවිධ වර්ගයේ මාළුන් (පොකිරිස්සන් ඇතුළු), හිරිගල්. වැලිපර විවිධ ගුහාවැනි මංපෙත් තුළින් යානය ගමන් කරනු අපි අත් දුටුවෙමු. මෙවැනි අසිරිමත් අත්දැකීම් අප කෙසේ කවදා දකින්නද ?

දවල් ආහාර ලබා සාප්පු ගොසින් නැවත අපි හුලුමාලේ දූපතේ අපේ නවාතැනට පැමිණ සවස්යාමය වෙරළේ ඇවිද්දෙමු. තුන්වැනි දින අපි ෆෙරියෙන් මාලේ ගොසින් නැවතත් තවත් ෆෙරියකින් විලින්ගිලි දූපතට ගියෙමු. එය මාලේ දූපත්වලින් උස්ම දූපතය. අපේ අවාසනාවද කොහේදෝ නැති වැස්සක් කඩා වැටිණි. අපේ මාර්ගෝපදේශක මූසා මහතා පවසන හැටියට විලින්ගිලය ඈත සමයෙදී මුහුදු ගොසින් මාළු අල්ලා ධීවරයින් ගොඩට පැමිණියේ මේ දූපතටය. මාළු ලේ වලින් මේ දූපත පිරී ඉතිරී ගියේය. එබැවින් මාළු ලේ වලින් පිරුණු නිසා මහා ලේ පසුව මාලේ වූයේ ය. දැන් මෙහි හොටෙල් කිහිපයක් පිහිටා ඇති අතර බොහෝ විදේශකයෝ වෙරළාශ්‍රිත ක්‍රීඩා සඳහා පැමිණෙත්.

ආපසු මාලේ දූපතට පැමිණි අපි මාලේ නගරයේ ඇවිද්දෙමු. සවස ආපසු අප රටට ආ යුතු බැවින් කාලය ඉතිරි කර ගත යුතුය. ජනාධිපති මන්දිරය අසලට පමණක් ගියෙමු. කණ්ඩායමේ ඊලග වැදගත්ම කාර්ය වූයේ උම්බලකඩ මිලදී ගැනීමයි. එබැවින් මාළු මාර්කට් එක ද බලා කියාගෙන උම්බලකඩ වෙළඳ පොළට ගියෙමු. අපේ මුදලින් රුපියල් 1800 වන උම්බලකඩ කිලෝව රුෆියා 100 කි. එනම් අපේ මුදලින් රුපියල් 950 කි.කරවල විකුණන්නේ ලාංකිකයන්ට පමණයි. මන්දයත් මාලේ වැසියෝ කරවල නොකති. එහි අය හොඳින් සිංහල කතා කරති. ඒ ඔවුන් අප රටට පැමිණ ඇති නිසා නොවේ. උම්බලකඩ මිලට ගන්නට ආ සිංහලයන් සමග කතාකොට ඉගෙන ගත් බැවිනි. මටත් ස්වාමි පුරුෂයාටත් උම්බලකඩ වෙළෙඳ පොළේ ගමනින් පලක් වූයේ නැත. අප දෙදෙනා ම නිර්මාංශිකයන් හෙවත් වෙජ්ජන් බැවිනි. හුලුමාලේ හෝටලය අසල සුපිරි වෙළෙඳසැලක ලාබයට ගත හැකි සාඩින් ටින් ද විය. අප සියලුදෙනාම මාලේ දිවයිනෙන් ආවේ මෙයට වඩා දින ගණනක් සිටින්නට සිතාගෙන විය යුතුය.



**ඒ. මාලිමගේ** (3140)
0112-862961
071-8323483

# මාතරත් ගාල්ලේදී හමුවෙයි.

**අප** සංගමයෙ සාමාජිකයො දිවයින පුරාම විසිරිලා ඉන්නෙ. ඉන් බස්නාහිර පලාතට ගැනෙන දිස්ත්‍රික්ක තුනෙන් (කළුතර, කොළඹ හා ගම්පහ) තමයි වැඩි පිරිසක් වාර්තා වෙන්නේ. මහ බැංකුවේ විශ්‍රාමික හැමෝම මෙම සංගමයෙ සාමාජිකයො නෙමෙයි. ඒත් අප සංගමයෙ සාමූහික කැප කිරීම් වල ප්‍රතිලාභ හැමෝටම පොදුයි. මේ පොදු බව ගැන හිතලම මීට වසර කීපයකට කලින් ප්‍රාදේශිය නියෝජිතයින් 19 ක් විශේෂ කලාප හැටියටත් හිතල පත් කර ගත්ත. විශේෂයෙන්ම ප්‍රාදේශිය එකමුතුවල සම්බන්ධීකරණය මේ නියෝජිතයන්ගෙ එක් කටයුත්තක්. දැනට රට වටා තිබෙන මහ බැංකු විශ්‍රාමිකයන්ගේ ප්‍රාදේශිය නියෝජිත එකමුතු වලින් තවමත් සක්‍රිය ලෙස මේ සංගමය සමග සම්බන්ධීකරණය වෙලා තියෙන්නෙ **පිළියන්දල එකමුතුව** හා **ගාල්ල එකමුතුව** විතරයි. ඒ අතරින් පසුගිය මාස 29 දා ගාල්ල එකමුතුව රැස්වුනා.

මෙවර ගාල්ල එකමුතුවට මාතර විශ්‍රාමික එකමුතුවෙන් සාමාජිකයො පිරිසකුත් සහභාගී වුනා. සංක්‍රිය බවකින් ඈත් වී ඇති මාතර විශ්‍රාමික එකමුතුව පන ගැන්වීමට සම්බන්ධීකාරක හෙවත් නියෝජිත වශයෙන් **ජී.පී. වීරසේන** මහතා පත්කර ගැනීමට මේ සංගමයේ අනුමැතිය ඉල්ලුවා. සංගමයේ විධායක කමිටුවට මේ ඉල්ලීම ඉදිරිපත් කිරීමෙන් පසුව විධායක කමිටුවේම එකඟත්වය මත වීරසේන මහතා මාතර ප්‍රාදේශිය එකමුතුවේ නියෝජිත වශයෙන් පත්කර ගන්නා ලද බව සතුටින් දන්වා සිටිනවා.

මෙදා ගාල්ල ප්‍රාදේශිය හමුවට මේ සංගමයේ සභාපති ජයලාල් ජයවර්ධන මහතාත්, ප්‍රාදේශිය නියෝජිත සම්බන්ධීකාරක ජගත් කාරියවසම් මහතා සහ සහකාර ලේකම් අමරපාල කරසිංහ ආරච්චි මහතාත් සහභාගී වුනා. සුහද හමුව පැවැත්වුනේ ගාලු දිස්ත්‍රික් සංවිධායක එදිරිසිංහ මහතාගේ නායකත්වයෙන් යුතුව ජගත් ද සොයිසා මහතාගේ දැකුම්කළු නිවස්නයේදිය. වෙනදාට වඩා සාමාජික සංඛ්‍යාව ඉහළ අගයක් ගත් අතර පවතින ගැටලු හා ඒවා කාලීනව විසදාගත යුතු ආකාරය පිළිබඳව දීර්ඝව සාකච්ඡා කෙරුනා. ජගත් ද සොයිසා මහතා සේවාවෙ ඉන්න කාලෙත් හරිම ක්‍රියාශීලියි. ඒ වගේම සුහදශීලියි. ඒ ඔක්කෝටම වඩා සෞන්දර්ය කලාවට ලැදියි. ගාල්ලෙත්, මාතරත් විශ්‍රාමික මහ බැංකු පිරිසක් හා විශ්‍රාමික සංගමයේ විධායක කමිටු සභිකයන් තිදෙනෙකුත් සිය නිවස්නට පැමිණීම ගැන අමන්දානන්දයට පත් වූ ඔහු ඔහුගේ ප්‍රහර්ශය සංවේදී කවි සටහනකින් වර්ණවත් කළේ මෙහෙමයි. ප්‍රනීත ආහාර පාන සංග්‍රහයකින් පසුව සවස් කාලයේදී හමුවේ සමාප්තිය සතුටින් සටහන් කළා.



සටහන - **ජගත් කාරියවසම්**

# දෝරෙ ගලා ගිය සතුට.....

සොමිනස,සතුට පුරවා මුව මඬල තුළ
එක්වී ඉසුඹු ලද අපගේ මිතුරු කැල
ඉරු දින පුරා දොඩමළු වී කථා කළ
හැම දේ රසයි විකසිත වුනි සිනා මල

මුලසුන දැරූ ජයවර්ධන මැතිඳු ගරු
එකිනෙක අවැසි දේ තේරුම් කරන තුරු
නිහඬව සවන් යොමුකළ ගති ගුණෙන් සරු
ඔබ හැම සිහිකරමි යලි මුණ ගැසෙන තුරු

විටෙකදි බැරෑරුම් ඉරියව් මවන මුවේ
ඔහු දොඩමළුයි, පවසයි රස කතා ලොවේ
මැතිඳුනි අමරපල් මා කී දෙයක් නොවේ
මැකිලා නැතිලු පෙම්බර බව තවම මුවේ

කී රස කථා සිට නිහඬව අසා ගෙන
විටෙකදි නැගිට පවසා අපි අපේ ගැන
පැණයක් ඇති තැනෙක පිළිතුරු සොයාගෙන
මතකද ඔබට ඒ සුන්දර උදෑසන

ආ මග කෙටියි,යා යුතු මග දුරයි කියා
මතකයි පොතක කොතනක හෝ තිබුණි ලියා
ඒ දිගු මගේ හෙමිහිට අපි දෙපය තියා
යමු ඉදිරියට අත්වැල් බැඳ තනිව නොයා

ඇරයුම මගේ පිළිගෙන නිවසට පැමිණ
දවසක් පුරා මගේ නිවහන තුළ රැඳුන
සොයුරිය,සොයුරු නිරතුරු මා හා බැඳුන
සිහිනය ඔබයි මිය යන තුරු මා දකින

වරදක් වුනා නම් තරහා වෙන්න එපා
දුටුවොත් මහ මගදි මග හැර යන්න එපා
ඔබෙ දුක, සතුට මට නොකියා ඉන්න එපා
මා මිය ගියොත් නෑ විත් නං ඉන්න එපා

සතුට ද, සොමිනස ද දෝත දරා අපේ නිවහනට පැමිණ, දවසක් පුරා අප හා රැඳී ඔබේ ගුණ සුවඳ හා දුක පමණක් ඉතිරි කර සමුගෙන ගිය ඔබට හෘදයාංගම ස්තූතිය !



**ජගත් ද සොයිසා ඇතුළු**
**පවුලේ සැම**
**071-4423518**



# පියාපත් අසිරිය....

පෘථිවිය මත ජීවීහු දියගොඩ අහස යන තුන්තැනම පැතිරී ජීවත් වෙති. ඒ එක් එක් තැන්හී වාසය සඳහා ඔවුන් පුදුමාකාර ලෙස හැඩ ගැසී නිර්මාණය වී ඇත. එම ස්ථාන අතුරින් අහස සැරිසරන්නේ පක්ෂීන්ය. එහි ඉහළ පහළ, ලගට ඈතට ගමන් කිරීම සඳහා, හුරුබුහුටි දැකුම්කළු පක්ෂි නම් සත්ව විශේෂය, සොබා දහම කදිමට හැඩගන්වා නිමවා ඇත.

පක්ෂීන් තුළ අප දකින විශේෂ හැකියාව අහසේ පාව, එහි තුළ දියගොඩ අන් සතුන්ට වැඩිවේගයෙන් ගමන් කිරීමට ඇති සමත්කමය. මෙම හැකියාවේ චමත්කාරය දුටු මිනිසා කලක් තිස්සේ කුතුහලයෙන් පසුව පියාසර නියමයන් අවබෝධයට ගෙන, පුදුම එලවන අති ප්‍රයෝජනවත් අහස්යානය තැනීය. අහස තුළ පාවීමට, එහි වේගයෙන් ගමන් කිරීමට. නා නා කුරුලු සමූහය සමත් වන්නේ කෙසේදැයි දැන් අපි සිතා බලමු.

කුරුල්ලෙකු බිමට නොවැටී අහස තුළ රැඳී සිටින්නේ පියාපත් සැලීමෙන් බව කවුරුත් දනිති. එහෙත් ඊට හේතුව කුමක්ද ? කුරුලු පිහාට්ටක් සමතලා නැත. එහි යටි පැත්ත අවතල නොහොත් බොකුටුය. ඉහළට ඇති පැත්ත උත්තලය, එනම් උඩ අතට රවුම්ය. මේ හේතුවෙන් තට්ට පහළට ගසන විට, වැඩි සුළං ප්‍රමාණයක් තෙරපීමට ලක්ව, වැඩි සුළං පීඩනයක් උඩු අතට තට්ට මත ක්‍රියා කරයි. එහෙත් තට්ට උඩු අතට ගසන විට එහි උඩට එසවුන රවුම් හැඩය හේතුකොට සුළඟ ඉවතට ලිස්සා යමින් සුළඟ අඩුවෙන් තෙරපීමට ලක්ව, තට්ට මත පහලට ක්‍රියාකරන පීඩනය අඩුය. දැන් තට්ටුව මත උඩු අතට වැඩි පීඩනයකුත් පහලට අඩු පීඩනයකුත් හට ගනී. එයින් පක්ෂියා මත උඩු අතට වැඩි බලයකුත් පහලට අඩු බලයකුත් ඇතිවේ. මෙම බල යුග්මයේ සම්ප්‍රයුක්තය උඩු අතට වී එමඟින් පක්ෂියාගේ බර අහස තුළ ඔසවනු ලබයි.

දැන්, සුළගේ පීඩනය හේතුවෙන් අහසේ එසවී සිටින පක්ෂියා තමන් රිසි දිසාවකට. තිරස්ව හෝ ආනතව ඉහළ පහළ දිසාවකට ගමන් කළ යුතුය. ඒ සඳහාද කුරුලු පිහාට්ට හැඩ වී ඇත. එම හැඩ යොදාගනිමින් කුරුල්ලා ඊට සුදුසු සුළං පීඩනය තමා වෙත ඇති කර අවශ්‍ය බලය ලබාගනී. මේ අයුරින් බලන විට අහසේ පාවීමටත් ඔබ මොබ පියාසර කිරීමටත් සුළඟ නොහොත් වාතය තිබිය යුතුමය. අහස ජයගත් විශාල බරක් ඇති අහස් යානයට ද මෙම අවශ්‍යතාවය පොදුය.

සුළගේ පීඩනය සෑම ඉගිලීමකට යෙදෙන අතර පක්ෂීන්ගේ පියාසර ක්‍රම අතර වෙනස්කම් පවතී. අහසේ පහල හෝ ඉහල අඩු සහ වැඩි වේගයෙන් ලගට හෝ ඈතට යනාදී වශයෙන් පියාසර හැකියා එක් එක් පක්ෂීන් අනුව වෙනස් වේ. එවැනි වෙනස් ඉගිලීම් තීරණය වන්නේ එක් එක් කුරුල්ලන්ගේ ජීවන රටා සහ අවශ්‍යතා අනුවය. තවද ඒ සඳහා ඊට අනුරූප වන පරිදි ඔවුන්ගේ පියාපත් සහ සිරුරු හැඩ ගැසී ඇත. මෙහිදී උකුස්සන් රාජාලීන් මද වශයෙන් පියාපත් සැලීම කර ඉහළ අහසේ පාවීම, විශේෂ හා සිත්ගන්නා හැකියාවක් ලෙස සඳහන් කළ හැකිය.

V හැඩයෙන් කුරුළු රංචු ඉගිලයාම තවත් දැක්මට ප්‍රිය උපදවන දර්ශනයකි. මෙය කොකුන් වැනි රංචු ගැසී වෙසෙන පක්ෂීන් ප්‍රදර්ශනය කරන ඉගිලීමකි. ඇත්තෙන්ම එය ප්‍රදර්ශනයක් නොව ඈත ඉගිලීම සඳහා එහි පහසුවට සොභාවයෙන් අනාදිමත් කාලයක සිට ලැබුණ ඉගිලීම් ක්‍රමයකි. සැලසුමේ පක්ෂීන් රංචුවක් ඉගිලෙන විට ඔවුන් අවට සුළගේ ඇතිවන විශේෂ වූ චලනය, දෙපස පක්ෂීන්ට ඉගිලීම පහසු කරන බව සොයාගෙන ඇත. එහෙත් ඉදිරියෙන් ඉගිලෙන පක්ෂියාට එම පහසුව නැත. ඊට ප්‍රතිකර්මය ලෙස ඈත ගමනේදී විටින් විට ඉදිරි පක්ෂියාගේ ස්ථානයට පසුපස එකෙකු පැමිණේලු. එමඟින්.....සැලැස්මක පක්ෂීන් ගමන් වෙහෙස සමව බෙදාගන්නා බව කියවේ. එහෙයින්....සැලැස්මේ ඉගිල්ලීම දැකුම්කලු මෙන්ම, පක්ෂීන්ට දායාද කළ සොබාදහමේ තවත් අනගි උපක්‍රමයකි.

කුරුලු හැකියා අතුරින් වඩාත් විශ්මයජනක සමත්කම් ඇත්තේ සංචාරක පක්ෂීන්ටය. ඔවුන් සැතපුම් දහස් ගණන් දුර ගෙවාගෙන ලෝකයේ එක් කෙළවරක සිට තවත් කෙළවරක ගොඩබිම් කරා ඉලක්ක සහිතව පියඹා යාමට සමත්ය. උතුරු අර්ධ ගෝලයේ ධ්‍රැවය ආසන්නයේ වෙසෙන පක්ෂීන් එහි සීත සෘතුව එළඹීමත් අධික ශීතලෙන් හා ආහාර හිඟයෙන් බේරීමට දක්ෂිණ අර්ධ ගෝලයේ ඔවුන්ට ආහාර සහ ආරක්ෂාව ලැබෙන රටවල් කරා කණ්ඩායම් සෑදී විශාල ගණනින් පියඹා යති. උතුරු අර්ධ ගෝලයේන් සීත සෘතුව පහවූ පසුව නැවත එහි එති. මෙම සාමූහික ඈත ගමන, එම පක්ෂීන්ගේ පරම්පරාවෙන් පරම්පරාවට වසරක් පාසා සිදුවන්නකි. ඇතැම් ආසියාතික පක්ෂීන්ද රංචු වශයෙන් එසේ සංක්‍රමණය කරන්නේ අධික වර්ෂා කාලය මග හැරීමටය.

එලෙස එක්ව සංචාරවල යෙදී පියාඹන පක්ෂි දසුන් අති සුන්දරය, කුතුහලය දනවයි. එම කුතුහලය ඔවුන්ගේ විශේෂිත හැකියා සම්බන්ධයෙනි. සැතපුම් දහස් ගණන් ඉගිලීමට ඔවුන්ට ශක්තිය කොයින්ද ? ඊටත් වැඩි පුදුමය ඔවුන් ඒ සා ඈත පිහිටි ස්ථාන කරා නිවැරදිව මං සොයා යන්නේ කේසේද? පක්ෂින්ගේ මෙම අපූර්ව හැකියා විද්‍යාවේද කුතුහලයට ලක්ව වසර ගණනක සිට ගවේශනය වෙමින් පැවතුනද මෙතෙකුත් පැහැදිලි නිශ්චිත දැනුමක් ලැබී නැත. මෙම කුරුල්ලන් පෘථිවියේ චුම්බක ක්ෂේත්‍රයට සංවේදී බවත්, ඔවුන් එහි රේඛා ඔස්සේ තම ඉලක්ක කරා ගමන් කරන බවත්, ඇතැම් විද්‍යාඥයන්ගේ මතයයි. දිවා කළ පියාඹන විට සංචාරක පක්ෂින් හිරුද, රාත්‍රී කල ගමනේදී යම් යම් තරුද, ගමන් මගී සොයා ගැනීමට යොදා ගන්නා බවද සැලවේ. ඒ අතර නියම මං සොයා ගැනීමේදී සංචාරක පක්ෂින් සතු විශේෂිත ජාන ඔවුන්ගේ ගමනට පිහිට වන බවද විද්‍යාඥමතයකි. මෙම මතය සනාථ කරන කරුණක්ද ඉදිරිපත්ව ඇත. එනම් පළමුවර ගමන් කරන නවක සංචාරක පක්ෂියෙකුට තනිව වුනත්, තම මව්පියන් ගමන් ගත් මං ඔස්සේ ඈත රටවල් කරා ගොස් නැවත නැවත ආපසු ඒමට හැකියාව ඇති බව සොයාගෙන තිබේ. සැබවින්ම එම හැකියාව විස්මිත ජාන වලටම සිමවු ප්‍රාතිහාර්ය පෑමක් වන්නේය. එය ඒසේ වුවත් එම එළදරව්ව විද්‍යාඥයින්ගේ අවසන් හේතු දැක්වීම ද නොවේ.

අපගේ පෘථිවිය නම් ලෝකය මත බහුලව වෙසෙන ජීවින් අතුරෙන් පක්ෂි සත්ව විශේෂය මිනිස් සිත්ගත් කොටසක් බව ඉඳුරා කිව හැකිය. ඒක ස්වරූපයකට අයත් වුව, ඔවුන්ගේ නා නා විධ හැඩ සහ පැහැයන්, එසේම හැසිරීම්, අප සතුටු කරයි. සත්ත්වයින් අතර මා හැඟි හැඟීම් වූ ආදරය ප්‍රේමය කුරුලු කුල අදාල ලොල් බර හැසිරීමෙන් මධුර ගී ගයමින් අත්විඳී. ප්‍රදර්ශනය කරයි. සොබා දහමින් පියාසර දායාදය ලැබ, සැහැල්ලුවේ ඉගිලෙන, එසේම සැහැල්ලුවේ දිවිගෙවන, නිදහසේ පෙම් වඩන මෙම පියකරු සත්ව විශේෂයට අපි වඩාත් ඇලුම් කරමු.

අභාෂය පක්ෂි පියාසරයෙන් නොවන්නට ලොවේ මා හැඟි යානය වූ , අහස් යානය ඉදි නොවන්නටද ඉඩ තිබිණ.

**ඩබ්.ඩී.ඒ. රේමන්ඩ්**





# To a dove ...

What grace and elegance you display
In seeming fondness for play
so aptly in The sky above
As you fly and glide gentle dove

Sleek shiny bird I envy you
That fortunate not I am too
To enjoy The freedom of the sky
So freely yours when you fly


In the morning evening sun shine
Few of you doves would combine
for a gameful awesome flight
In a chosen area at clouds height

Bird you are then joyfully using
Gift of flight a nature's blessing
for long you fly glide and dart
Great though heights at home and smart

you fly at times for hours on end
Flapping wings to that extend
I marvel form where the energy is
That let you fly fly with such ease

Sweet pet and messenger of yore
Royal secrets of love and war
Faithfully over distances you bore
Swiftly on wings off with a soar

After turning out scavenger crow
Didn't He any amusement draw
At your cooing inclined to amour
yet so full of innocence and langour



W.D.A.Raymond (554)
011 2231357
077 1010946

# ඔබත් හරිම පුසුඔයි.

**ස**මස්ත කලා නිර්මාණ කෙෂ්ත්‍රයම හඳුන්වන පොදු නාමය තමයි 'සාහිත්‍යය ' කියන සංඥා නාමය. රස විඳිය හැකි, රස විඳිය යුතු, රසය ආත්මය කර ගත් නව කථා, කෙටි කථා, චිත්‍ර, මූර්ති, සිනමා කෘති, නාට්‍ය, ගීත, ශාන්ති කර්ම වැනි කී නොකී බොහෝ අංග ප්‍රත්‍යාංග මෙන්ම කාව්‍ය රචනා ද ගැනෙන්නේ 'සාහිත්‍යය' නම් වූ පුළුල් පරාසයට යි.

මෙහිදී කාව්‍ය රචනා හෙවත් පද්‍ය විශේෂ කොට දැක්වූයේ විශේෂයක් නිසාමයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමික සංගමය 2016 ජුනි මාසේ 01 දා, රාජගිරිය මහ බැංකු 'විදු පියස' හිදී සවස 0300 කණිසමේ ඉඳල හිරු සැඟවෙනකම් කවි රස වින්දනයක් කළා. ඒ සඳහා එදා එතැනට මහ බැංකු විශ්‍රාමික මහත්ම මහත්මීන් විශාල පිරිසක් ආවා. කවි රස වින්ද. අද විශ්‍රාම සුවයෙන් සිටියත් එදා ඒ කවි රස විඳල ජීවිතයට නව ජවයක් ලැබුව... "ඇත්තටම කවි කොයිතරම් රසවත් ද කියලා වෙනදාට වඩා අද දැනෙනවා. විශේෂයෙන්ම ශෘංගාරයට බර, රොමෑන්තික් ගුණයෙන් අනූන කවි රස විඳලා බොහෝ දෙනෙක් අතීත යෞවනය තුළට සමවැදුනා. විටින් විට ඒ කවි රචනා කරපු අද්විතීය කවියා දිහා හොරෙන් හොරෙන් වගේ බැලුවෙ මෙච්චර කාලෙයක් මේ කවි කොහෙද හැංගිලා තිබුණේ කියල දැන ගන්න වගෙයි. සාන්ත දාන්තව ඉදිරිපෙළ පුටුවකට වෙලා සිටිය කාව්‍ය රචකයා හෙවත් කවියාගේ මුව පුරාම සතුටු හිනා රැළි තරංග දිදී විහිදෙන හැටි කවුරුත් දැක්කා.

ඒ කවියා අපේම කවියෙක්. රසවතෙක්. ප්‍රඥාවන්තයෙක්. ශෘංගාරය හොඳින් හඳුනන්නෙක්. හැම වතාවෙම 'සැඳෑව' කවි පිටුව සැබෑ කාව්‍යෝක්තිවලින් සරසන්නෙක්. ධවනිතාර්ථ, ව්‍යංගාර්ථ, වක්‍රෝර්ථ. නිර්මාණය කරනව වගේම, විරිත , රිද්මය, එළිසමය හා සරුසාර උපමා අලංකාර පවා සුහුඹුල්ව යොදනවා. අපේ සැබෑ කවියා විසින් එළි දක්වන ලද **"නුඹ තවමත් සුවඳ මලකි"** කාව්‍ය සංග්‍රහය පිළිබඳ එදා කෙටි විචාරයක් කරන ලද්දේ මහාචාර්ය ප්‍රනීත් අභයසුන්දර මහතා විසිනි. එමෙන්ම අප සංගමය වෙත මෙම අනගි සුන්දර, අරුත්බර අවස්ථාව සම්ප කරමින්, අනුග්‍රහය පුද දීමට දැවැන්ත කාර්යභාරයක් ඉටු කළේ අප සංගමයේ සාමාජික, ප්‍රවීන, ගායක **යසපාල පෙරේරා** නම් රසවතානන්ය.

අප සංගමය නේක විධ හපනුන්ගෙන් පූර්ණය. මේ කාව්‍ය සංග්‍රහය කළේ ඉන් එක් අයෙකි. බරපතල රෝගී තත්වයකින් පසු වෙමින් සිටිය ද, ඒ ගැන පසුතැවිලි නොවෙමින්, පොපියන චමත්කාර ජනක මානසිකත්වයකින් නිර්මාණ කාර්යයෙහි නියැලෙන ඔහු මෙම පද්‍ය නිර්මාණයෙන් ලැබුන යමක් සමඟ ඔහුගේ පෞද්ගලික මුදලින් ද විශාල අනුග්‍රහයක් මහරගම පිළිකා රෝහලේ සුව සේවා අරමුදලකට පරිත්‍යාග කළා.

මේ අද්විතීය කවියා අන් කවරෙකුවත් නොව **කඩවත, නුවරපාරේ, අංක 67 දරණ නිවසේ අධිපති ටී. ඒ. ජී. ගෝමිස් හෙවත් ගෝමී** නම් වන්නේය. ගෝමී කවියාණෙනි **.ඔබත් හරිම පුසුඔයි.**



**විශ්‍රාමික සංගමයේ සභාපති විසින් මල්මාලාවක් පළඳා කවීන්ද්‍ර ගෝමී පිළිගැනීම**

# මනස් පොජ්ජ මංදො කළා...?



**ස**මුගත් විධායක කමිටුවේ මෙහෙය වීමෙන් 2016 පෙබරවාරි 27, 28, හා 29 කියන දින තුන තුළ ගතකළ තුන්දින චාරිකාව ගැන උක්ත මාතෘකාවෙන් යුතුව කුඩා සංස්කාරක සටහනක් තැබුවා ඔබට අමතක විය නොහැක. එහි එක්තරා තැනෙක ධෛර්ය සම්පන්න අප සාමාජිකයෙක් ගැන ද සටහනක් ඇත. ඔහු ගැන, සටහන් කළේ 'හිත ඇත්නම් කළ නොහැක්කක් නොමැත' කියලයි. එදා ඔහු සීගිරිය ගල මුදුනටම නැග්ග බව සාඩම්බර සටහනකි.

ඔහු කවදත් අප සංගමයේ චාරිකාවලට නිරතුරුවම සහභාගීවන විශ්‍රාමිකයෙකි. යම් තරමකට ඇවිදීමේ අපහසුවක් පැවතියත් චාරිකාවලදී උපරිම විනෝදය ලබන විනෝදකාමීයෙකි. තුන්දින චාරිකාවේ දෙවැනිදා (28 දා) අප ගියේ සීගිරිය නැරඹීමටයි. බොහෝ සාමාජිකයන් අවට විවිධ සෞන්දර්ය නරඹමින් සිටිත් දී සීගිරි ගලට නැග්ගෝ ද කිහිප දෙනෙකි. එහිදී දැවැන්ත හැරමිටියක් ආධාරකයක් ලෙස අතට ගත් ඉහත කී ධෛර්යවන්ත පුද්ගලයා හෙමින් හෙමින් සීගිරි රජදහනේ උච්චතම මුදුනට ළඟා වූවේය. ධෛර්යවන්තයින් ඉදිරියේ කඳුහෙල් මිටියාවත් බවට පත්වෙන බව මේ මඟින් ද පසක් වේ. පසුගිය කලාපය සංස්කරණය කර අවසාන වනතුරුත් ඡායාරූපයක් ' සැඳෑව ' වෙත ලැබී නොතිබුණ නිසා, එම ප්‍රමාද දෝෂය සරිකරනු වස් මෙම කලාපයේ මෙසේ පළකරමු. එම ධෛර්ය සම්පන්න අප සාමාජිකයා වන්නේ විශ්‍රාමික අංක 1113 දරණ එච්.එම්.කේ. ද සිල්වා හෙවත් **කමල් සිල්වා** මහතාය.





## *Every body on earth has a story*

A 24 year boy seeing out form the train's window shouted... "Dad, look the trees are going behind; they are moving very fast" His dad simply stared at him with so much joy and smiled ! A young couple seated nearby, looked at the 24 year old and thought to themselves, He' s so grown up but so childish, he must have a mental disorder for his father not to be bothered. Suddenly the young man exclaimed again, "Dad ,look the clouds are running with us !" The couple clouds not resist and said to the old man, why don't take "your son to a good doctor, maybe a psychiatrist; The old man smiled and said " I Just did. we are just coming from a doctor but not a psychiatrist , We are just coming from the hospital. My son was blind from birth. He just got his sight today for the very first time, his behavior may seem stupid to you, it's more then a miracle to me."The young couple just sat down there, lost for words, with a mixture of tears and shame in their eyes...

Everbody on earth has a story; don' judge people so fast or jump into conclusion about their private affairs; you don' t know where they are coming from or what they have to deal with. The truth behind their story might surprise you. Take it easy with others, even if you have a perfect life. Let us keep working towards the good of all !!!

Source : holy Trinity Community Magazine January 2016

Sent by : **Yvonne Amarasekara**
**0112 645 162**

පැදි විදි



# නොදකින දැක්ම...

රන්වන් පැහැති ඇත් යුවලක් දකින්නට
ලැබුණා ගොසින් සිරි දළදා වඳින්නට
කවුරුද කැප වුනේ ඒ රූ මවන්නට
දුක්බර කථාවකි ඇති මුල පුරන්නට

කොටි රකුසන් ගැසූ හෙණ ගෙඩියෙන් රුදුරු
මහ බැංකුවෙදි සවි දිවි පිදුවන් සොඳුරු
අතරට එදා මේ සොයුරුත් වී ගොදුරු
නොසිතුව ලෙසක නෙත් යුගලම වුණි අඳුරු

සරණක් සොයාගෙන ගියමුත් එතෙර දෙසත්
සුවයක් දකින්නට බැරි වී නොපැතූ ලෙසත්
පමණක් ඉතිරි වී සවනට ඇසෙන බසත්
නැතිවී ගියා ඔහු පෙම්කළ තෙවැනි ඇසත්

අඹුදරු නෑසියන් මිතුරන් තරම් හැඬූ
දෙසවන් ගැටී මෙත් සිතකිනි දිරිය වැඩූ
දස්කම් තිබුණ කොයි දේටත් නැතිව අඩූ
අද එක්වෙලා ඇත අතරට ඇඟිලි තුඩු

කඩදහි කැබලි මැලියම් ගා තුඩෙන් තුඩ
තබමින් සැදුන රන්වන් ඇත් යුවල හැඩ
දළදා සමිදු අභියස හිමි වෙලා ඉඩ
පහත මාලයේ දෙපසින් සිටී වැඩ

කාලය ගෙවන විට අටලෝ දම හැඳින
මිනිසකු නොවී දොම්නස් සිතකින් විඳින
මඟුලක ඉලව්වක වෙහෙරක මුණ ගැසෙන
ඔබ වියතෙක්ය තවමත් ලෝකය දකින

මංගල දිනේදී මගෙ සිහිවටන තියා
මතකයි ඔබත් අප හා නිකවැරටි ගියා
සිත බලකළා කිසිවක් තෙපලන්න කියා
වරදක් ඇතොත් මට දොස් නොකියන්න **'පියා'**


(1996 ජනවාරි 31 දින ශ්‍රී ලංකාවේ මහ බැංකුවට එල්ල වූ ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාරයට ලක් වීමෙන් සිය දෙනෙක් අහිමි වූ **පියදාස විජේසිංහ** සොහොයුරාගේ ආගමික හා කලාත්මක කර්තව්‍යයන්ට උපහාරයක් වශයෙනි.)



**පේමදාස අතාවුද**
**0112 928944**
**077 3410528**

## ගෝමිට මල් මිටයි !!! සංගමයට මල් මිටයි !!

**2016** ජනවාරි මැයි **''සැඳෑව''** තුළින් හා පෞද්ගලිකව ලැබුණු ආරාධනාව මත ජූනි පළමුවන දින ගෝමිස් අයියා විසින් රචිත ඔබ තවමත් සුවඳ මලකි කාව්‍ය සංග්‍රහය දොරට වඩින බැව් දැනගතිමි. එදිනට එහි යාමට ලක ලැහැස්ති වී සිටිය මුත්, ''රුක්මණී දේවි අනුස්මරණ සංගමයේ'' සභාපති වීම නිසා පැවරුණු වැඩ කොටස කිරීමට පරිගණකය හා සටන් වැදීම උදෙන්ම ආරම්භ කළෙමි. ඒ අතර තුර ෆර්ඩි ගෙන් ලැබුණු දුරකථන ඇමතුමෙන් දැනුම් දෙනු ලැබුවේ අද මතක ඇතිව දහවල් රාජගිරියේ මහ බැංකු අභ්‍යාස විදුහලට පැමිණෙන ලෙසයි. යසපාල මට කිව්වා සතිස්ලාල්ට යි, ඔයාට යි විශේෂයෙන්ම දැනුම් දෙන්න කියලා...හරි හරි මම එනවා ෂුවර්... මා කර ගෙන ආ වැඩය නොනවත්වාම කරගෙන ගියෙමි. හරියටම දවල් එකට පමණ දුරකථනයෙන් කතා කළේ කරසිංහආරච්චියි.'ආරි එනවා නේද?' මම නම් එන ගමන්. දෙක වෙනකොටවත් ට්‍රේනිං කොලේජ් එකට එන්න...වරද්දන්න එපා...' ඉන් තිගැස්සුණු මම පරිගණකය නිහඬ කර දහවල් බත්පත කටට දෙකට



**කිවිසුරු ගෝමි අතින් මහැදුරු ප්‍රනීත් අබේසුන්දර මහතාට ප්‍රථම කවි පොත පිළිගන්වමින් ......**

ගිල දමා, රාජගිරියේ වූ බැංකු පියස කරා ගොඩ වැදුනෙමි. එහි ගිය මට දක්නට ලැබුණේ එවකට බැංකුවේ සේවය කළ ලොක්කන්, පොඩ්ඩන් හා කලාවට ලැදි මිතුරන් සමඟ කතාබහ කරන ගෝමිගේ පවුලේ උදවියයි.


උත්සවය ආරම්භ කෙරෙන කාලය ළං වෙත්ම, පිරිස දෙසියයක් පමණ එහි වූහ. ආරාධිත අචාර්ය ප්‍රනීත්

අබේසුන්දර මහතා හා ගෝමිස් අය්යාව බුලත් හුරුල්ලක් දී පිළිගනු ලැබුවේ විශ්‍රාමික සංගමයේ ලේකම් හා සභාපති තුමන් විසිනි. ඉක්බිතිව සියල්ලෝම සභා ගර්භය තුළට පියමන් කළහ. වේදිකාව මත වූයේ පුටු තුනක් පමණි. කාව්‍ය සංග්‍රහය දොරට වැඩීම වස් වෙහෙසුනු, කැපවුනු, යසපාල පෙරේරාත්, ගෝමිස් අයියාත් තවමත් ඉදිරිපෙළ අසුන් මතය.

මහත් ගාම්භීර ස්වරයකින් හා සංවරයකින් යුක්තව මයික්‍රොෆෝනය අතට ගත් අමරපාල කරසිංහආරච්චි වේදිකාව මතට ආරාධනා කළේ ආචාර්ය ප්‍රනීත් අබේසුන්දරට, හිටපු සභාපති ලක්ෂ්මන් සිල්වාට හා වත්මන් සභාපති ජයලාල් ජයවර්ධන මහත්වරුන්ට පමණි. යසපාලටත්, ගෝමිටත් ආරාධනා නොකිරීම මට ප්‍රහේලිකාවක් විය. පසුව ඒ පිළිබඳ විපරම් කර බැලූ මට දැනගන්නට ලැබුණේ, ගෝමි අසනීප බැවින් වේදිකාවට නැගීමට අපහසු බවත්, ගෝමිගේ තනියට යසපාල ඔහු අසලම අසුන්ගත් බවත්ය.

උත්සවයේ වැඩ ආරම්භයේදී ම කැඳවීමේ නිවේදනය කියවනු ලැබුවේ ජයලාල් ජයවර්ධන මහතා විසිනි. විධායක කමිටු රැස්වීම් වලදී හා ලිපි ලිවීමේදී ඉංග්‍රීසි භාෂාවෙන්ම කටයුතු කළ ඔහු එදා සභාව ඇමතුවේ ඉතා හොඳ සිංහලෙනි. උසස් වැකි හා නිදසුන් ආදිය ගෙන හැර පාමින් ඔහු කළ කතාව කාගේත් සිත් ඇදගන්නා සුළු විය.

ඉන්පසු සභාව ඇමතුවේ සංගමයේ හිටපු සභාපති ලක්ෂ්මන් සිල්වා මහතායි. ගෝමි සේවය කළ හැටි, ප්‍රාදේශීය කාර්යාලවල කළ සේවාවන්, ඔහුගේ හැසිරීම් ආදිය සියල්ල ගෙනහැර පෑම ලක්ෂ්මන් ගේ කතාවේ අන්තර්ගතවී තිබුණි. උත්සවය අවසානයේදී ලක්ෂ්මන් කීවේ ගෝමිට වේදිකාවට ගොඩවීමටත්, කතාවක් කිරීමටත් අපහසු බැවින් ඔහුගේ කථාවත තමාටම කිරීමට ඔහු උපදෙස් දුන් බවයි.




ත

දේශක ආචාර්ය ප්‍රනීත් අබේසුන්දර මහතාටය. තමා විදේශ රටක සිටියදී මෙම කාව්‍යමය මුල් පිටපත ඔහුට ලැබුණු බවත්, එහි වූ ගුණ අගුණ හා සෝදුපත් කියවීමට තමාට භාරවුන බැව් පැවසූ ප්‍රනීත්, මහ බැංකුව වැනි උගතුන් සිටින ස්ථානයක මෙම කාව්‍ය සංග්‍රහයේ රසාත්මක භාවය හා ගුණාත්මක භාවය ඉදිරිපත් කිරීමට ලැබීම සතුටට කරුණක් බැව් පැවසීය. ගෝමිට තව තවත් කාව්‍ය ලිවීමට ධෛර්යය හා නිරෝගීභාවය ලැබේවා යි ඔහු ප්‍රාර්ථනා කරමින් සභාවෙන් සමුගතේය. මෙම උත්සවය අතතුර ගෝමිගේ කාව්‍ය සංග්‍රහයෙන් උපුටා ගත් කාව්‍යයන් කිහිපයක් ගායනා කරනු ලැබුවේ පවුලේ ඥාතියෙක් වූ සුබසිංහ මහතා විසිනි. මෙම කාව්‍ය සංග්‍රහය හා ගෝමිගේ දායකත්වයත්, ඔහු මෙතෙක් ආ ගමනත් ඥාතියා විසින් සභාව ඉදිරියේ ගෙන හැර පෑවේය. මගේ ජීවිත කාලය තුළ මා ඇසූ ලස්සන වදන් සහිත අර්ථවත්ම ස්තුති කතාව මෙය බැව් මම පෞද්ගලිකවම ප්‍රකාශ කරනු කැමැත්තෙමි. මෙම වචන සමුච්චයම මම සුබසිංහ මහතා ඉදිරියේදී ද එදා නොපසුබවට ගෙන හැර පෑවෙමි.

මෙම කාව්‍ය සංග්‍රහය දොරට වැඩීමේදී එකම වහලක් යට, දිගු කලක් එකට සේවය කොට දැන් රෝගී තත්වයේ පසුවන ගෝමිගේ දක්ෂතාවය, හැකියාව හඳුනා ගනිමින්, අනෙකුත් සහෝදර සහෝදරියන් ඉදිරියේ ගෙනහැර පෑමට යසපාල පෙරේරා ගත් ප්‍රයත්නය අතිශයින්ම සාර්ථකය.

එම ප්‍රයත්නය සාර්ථක කිරීමෙහි ලා විශ්‍රාමික සංගමය ගත් ක්‍රියා මාර්ගය ද අතිශයින් වැදගත් බව පැසසිය යුතුය.



උත්සවය අවසානයේ යසපාල පෙරේරා මහතා පැවසුවේ "මේක ලෑස්ති කළේ මායි. වීරයෙකු වෙන්න මට අවශ්‍ය නැහැ...වැඩේ හොඳට ගියා නේද ආරි...? මට ඕනෑ කළේ ඒකයි..."යසපාල දෙස කාරුණික බැල්මක් හෙළූ මම " හොඳයි...හොඳයි" කියා ඔහුගෙන් සමුගතිමි.

**'ඔබ තවමත් සුවඳ මලකි'** කාව්‍ය සංග්‍රහය දොරට වැඩීමේ උළෙලට සහභාගී වූ අපි සැවොම ගෝමිට මල් මිටයි!!! විශ්‍රාමික සංගමයට මල් මිටයි !! පුද කරනු කැමැත්තෙමු.



**ආරියදාස තන්ත්‍රිගේ**
**උප සභාපති**
**0112-811049**
**071-8064238**

පැදි විදි

# සුභාශිංසන

(විශ්‍රාමික කාන්තා සංසදය ඇරඹීම නිමිත්තෙන් )

රිදී සඳුරැස් අඳුරු තුරු හිස් සිසාරා පහළට ගලන විට
ඈත කොවුලා පියඹ සමඟින් මිහිරි ගී සතුටින් ගයන විට
සොඳුරු සැන්දෑ කාලයක හුදකලාවම නිවසේ සිටින විට
එකම සෙවනෙහි එකට සිටි කාලය නැගෙනු ඇත ඔබේ සිහියට

මිහිරි තෙපුලෙන් කවට වදනින් සිනා රසයෙන් පිරුන කාලය
ගුණ නුවණ වැඩි දියුණු කරමින් සතුට සැනසුම සෙවු කාලය
සියලු කටයුතු කඩිසරව නිම කර සැමගෙ සිත් දිනූ කාලය
සදානුස්මරණීය වෙයි බැංකුවේ අප ගතකරපු කාලය

කුරුළු රෑනක් ලෙසින් නිදහස් ලොවක අසිරිය පැතූ කාලය
පාට පාටැති සාරි ඇඳ මල් කුමරියන් සේ දිලුන කාලය
සොඳුරු ලොවකට අනාගත සුභ සිහින දකිමින් ගෙවූ කාලය
කෙලෙස අමතක වේද මිහිරෙන් මිහිර පෑ ඒ තුරුණු කාලය

හිරු සඳුට නොකියාම රහසේ වසර ගණනක් ඉකුත් වී ඇත
කෙමෙන් කාලය ගෙවී යද්දී ගත සිතද දැන් දුබල වී ඇත
අප ද වියපත් වූ සෙයින් රූ සිරි ද ටික ටික මැකී ගොස් ඇත
"කාන්තා සංසදය"ඇසුරින් යළි වසන්තය උදා වනු ඇත

බිරිඳ සැමියා ජීවත්ව නැත දරුවන් ද රට හැර ගොසින්
පාළු රජ දහනක තනිව කඳුලැලි පිසිය යුතු නැත ඉතින්
බැංකුවේ දෙටු "කාන්තා සංසදය"සමඟින් සන්තොසින්
ඔවුනොවුන් වෙත සුහදතාවය පුදමු හද පිරි සෙනෙහසින්

මව්පියන් සහ සැමියා ද රැක බලාගෙන යුතුකම් කළේ අපි
දූ පුතුන් සිහසුන තබා ඉහළින්ම කටයුතු ඉටුකළෙත් අපි
දියණියක බිරිඳක මවක මිත්තනිය ලෙස අද ලොව දකින අපි
වගකීම් දැන හැඳින මැනවින් නොනැවතී ඉදිරියට යමු අපි

විශාකා සිටුදේවි සතු මෙත් ගුණය ඔබෙ හදවත රැදේවා
තෙරේසා මව්තුමිය මෙන් කරුණා දයාගුණ හද පිරේවා
දුකක් විපතක් දුටුව තැනකදි ඔබේ හදවත මොළොක් වේවා
උතුම් අරමුණු පසක් කරමින් "සංසදය" ඔබෙ දිනේවා

-චන්ද්‍රා මදනායක-
0112-855773

පැදි විදි

# දෝතින් ගන්නම්.....

ගැ. සිහිල ගුලිකරන් වළා ඇබින්දක්
පහළට ආවා නම්
පොදක් නොවේමැයි විලක් තරම්මැයි
දෝත පොවන්නේ මං


පි. යන එන ගමනේ පා පටලැවුනේ
පෙර හැඳුනුමකට නම්
තුරු හිස නමලා එබිකම් කෙරුවේ
වනපස කැකුළට මං

පි. වස්දඬු සුසුමේ සත්සර පැටලී
මිහිරක් ගෙන දෙයි නම්
සුසිනිඳු තොල් පෙති සිපඑන පවනැළි
රටා මවනවා දැන්

ගැ. එන බව නොකියා හනිකට ආවේ
යන්න බලාගෙන නම්
නෙත් ගං දෑලේ ඉවුරු තලා යේ
ඇඟිලි තුඩට රහසින්

පි. නා මෙනවියනේ ගී හඬ නැගුනේ
වැලි තල මත දී නම්
සර පිරිමැදුනේ ගී මී පිරුනේ
මටම කියා පවසන්

ගැ. මල් පොඩි පිපුනේ සුවඳින් වැඩුනේ
බඹරුන් උදෙසාමයි
සුවඳ මලක් මිස දැග නෑ වැඩිපුර
දෝතින් ගන්නේ නම්



අමරපාල කරසිංහ ආරච්චි
038-2234226

# සැඳෑ සමය

ආදර මව්පියො තම ගුරු දෙගුරු
දුබලය අතපය දැන් නැත වාරු
කන බොන අය සහ ගන්නට සාලු
දරුකැල මෙහි නැත විසිර ගි යාලු

අගහිගකම් ඇත අරපිරි මැස් මට
හිතකය නිතරම යොමුකර ගැන් මට
තියෙන දෙයක් කා සැනසී ඉන් නට
නොම දෙමි ගැහැටක් අපෙ දරුවන් හට

බඩුවක් මිලදී ගන්නට තැන කින්
වාරුකරන් ගෙන ඒමට සතු ටින්
දුබලය කය මගෙ අඩුවකි පිට තින්
සතුටකි දරුවෙක් හිටියොත් ළඟ කින්

යුතුකම දන්නෙද දරුවන් විල සින්
පිනකි ලබන්නේ දැන් සැලකුවො තින්
ජාතිජරා මරණෝට යොමු වෙන කන්
නොයිද පුතේ දැන් දැන් පිං කර පන්

මළගම කොයිලෙස ගත්තත් කම් නැත
පරකාසෙට නොයදනු ඔය නුඹෙ සිත
සලසා ගැනුමට සගපුර සුව සෙත
සමිඳුන් වෙත යොමු කරනුය නුඹෙ සිත



-ජී.එච්.ඒ.ප්‍රනාන්දු-

# පාට පාට ලෝකයක්

ලැබගනු පිණිස මුදලක් මාගේ          අතට
රැකියාවට ගියා ලොකු නෝනා          ලගට
පිළිවෙල කියා දීලා තෝරා          යසට
පාට පාට කොසු ලැබුණා මගෙ          අතට

රතු කොස්සෙන් කුස්සිය නිති          අතුගානු
කහ කොස්සත් සාලයටම තබා          ගනු
ගරාජයේ නිල් කොස්සකි බලා          ගනු
පාට අනුව ඔක්කොම මතකයට          ගනු

පාට පාට හැම කොස්සම හඳුන          ගෙන
අතුපතු ගෑම මට කරදරයක්ම          වින
කෙසේ වුවද ඒ ඔක්කොම හිතට          ගෙන
පාට මාරු විය නෝනට ඕන          තැන

දෝණිව රැගෙන යන එන විට පා          සලට
මිතුරා ගේන කාරය විය රතු          පාට
දහවල්  යන විටදි පිහිනුම් තටා          කෙට
හැඩි දැඩි සුදුපාට තරුණෙකු ඇත          එයට

නයිට් ක්ලබ් එකේ විසුමට යන          කලට
තව පාටක වාහනයක් එයි          ළඟට
සුදු දත් විලිස්සා ගෙන කන්මුල          දෙසට
ඉන්නා විට පෙනේ මුහුණේ කළු          පාට

මැච්ර්ස් බලන්නට එන යාලුවා          වෙත
පාට පාට රේසින් කාරයක්          ඇත
තවත් කාර් ඇත පාටක් නිච්චි          නැත
නෝනගේ ජීවිතේ පාටට ඉමක්          නැත



**සුමිත්‍රා තිලකරත්න (1368)**
**071-4985235**

# නික්ම යාම

සිදුහතුන් නික්මුනේ - ලෝ සතුන් මුදවන්න

ඔබ ගෙයින් පිට වුනේ - අන් ළදුන් පිනවන්න

මහරජගේ පිරිස වෙති - යසෝ දා රැකගන්න

මට වුනේ ලැජ්ජා වේ - කුලී ගෙයි හැංගෙන්න

කිරි මවුන් පේ වෙලා - රාහුලව නලවන්න

දරු නොලද මා - දෑස කඳුලින්ම පුරවන්න

මගෙ නොවෙයි නුඹ වෙන එවුන්ගෙයි

පවසමින් සිත් බින්ද

හැඟුම් බර වූ මතක සිතුවම්


අමතක කලේ මන්ද

ගෙවා දමනට සසරේ

උසුලා එන දුක් කන්ද

කසාවත් පෙරවන්නට

සිතට සිතුනේ කිම්ද ?



**ජගත් කාරියවසම්.**

**038 2236643**

# රංචාගොඩ ළමයාගේ කවි

පිරිසිදු බුද්ධ ධර්මෙ ලොව සැමටම බෙදනවලු
කිරිකැටි දුවාදරුවො දවස ගානේ බිලි දෙනවලු
හරි හැටි කටවල් නැති දෙස් පාලුවෝ අමන වදන් දෙසනවාලු
කරියට ගත් ගව ගාතන සුළු කොට හැම තකනවාලු

when the man goes against the nature
one day the nature will go against the man
මේ ගුණ කියමන T. S. එලියට් කීවේ දශක දාහතකට පෙරයි නේද ?
අපේ අම්බරු ඇත්තන්හට තවමත් මෙය වැටහී නැත්ද ?

ජැන්ඩි පහට ඇඳුම් ඇඳල කතුන් නිතර රවටාවී
සින්ඩි ගීත ගයා වයා නුර්ති ගීත වනසාවී
බ්‍රැන්ඩි බීපු තරුණො මත්ව නැති ඔලු ගෙඩි වනාවී
පණ්ඩි මුන්ට හතර අතේ හැම දොරවල් ඇරේවී

වයස අසූවේ අම්මව බලුකූඩුවෙ සිරකරනව
සිරස කෙලින් කරපු පියා කනත්තටම දක්කනවා
පවස නිවා දැමූ ළිඳට අවමන් කොට සයුර නිතර වනනවා
දවස ගානෙ අපේ ඇත්තො පවු කඳු-කඳු ගොඩ ගහනව



**ආචාර්ය, කලා විභූෂණ දේශබන්ධු,**
**දේශමාන්‍ය කලා භූෂණ**
**සඳුන් විජේසිරි.**
**0777-119177**




# අමාරිස් අයියා....

"ඩ්‍රැනේජ් පෝච්චියක් දාන එක තමයි හොඳ.  මදුරුවෝ බෝවෙන්නෙත් නෑනෙ." රාලහාමි කථාවට මුල පුරයි. ගම පුරා පැවති වල වැසිකිලි ක්‍රමය ඉවත්වෙමින් අතමිට සරු අය වැසිකිලි පෝච්චි මිලදී ගෙන සවි කර ගනිති.

"පෝච්චි දැම්මා වගේ නෙවෙයි. රෑට පරිස්සමෙන් යන්න ඕනේ." එතැන සිටි විෂ වෙද මහතා පවසයි.

"ඒ මොකෝ?"

"ඔය පෝච්චියේ සීතලට පොළඟා හරි කැමතියි. ගුලි වෙලා ඉන්නේ. මම ලඟදිත් බේත් කලා ගෑණු කෙනෙකුට.....

"කොහේද කාලා තිබුණේ.?" අයෙක් ඔලොක්කුවට මෙන් අසයි.

"ඒවා ඉතින් කියලා වැඩක් නෑ."

"ඒක හැබෑව.නරක තැනකට දෂ්ඨ කරන්න ඇති."

අමාරිස් අයියා කථාවට එක් වෙයි.

"මහත්තයාට කියන්ඩ මහත්තයා, .....අපේ මේ මලය පොඩි කාලේ මොනවද ජරාවක් කාලා බඩ අතගගා අකුලකට රිංගුවා. විශ්වාස කරන්ඩ මහත්තයා  මේං....... දිග නයා."

"නයා ගැහැව්වද?

"ගහන්නේ කොහෙද? ඌ නහය වහගෙන ගියා ගියාමයි. පැත්ත පළාතේ ආවේ නෑ. මෙයා කාල තිබුණ දේවල් හැටියට එතන සතෙකුටවත් ඉන්න බෑ."



**විජේරත්න අතුකෝරල (3391)**
**(සැමුවෙල් රුදිගෝ පොතෙනි)**

## Broken bangles

***Father*** (to son with anger)
Where had you been la*st* night?
***son*** : I had taken some of my boy friends for a joy ride in our new maruti.
***Father*** : Well, but tell them not to leave their broken bangles in the car future.

## Crying

***Hasband*** : Do you see your son? How he is weeping and insisting to have a ride on that donkey.

***Wife*** : Then what calamity has fallen ? make him ride on your back and he will Stop crying.




## Opportunity..

***Judge*** : How did you dare steel this diamond necklace from that jeweller 's  Shop?
***Thief*** : It was written there " Don't miss this golden Opportunity."

source books and magazines  **Hema Wimalasoma**
**0112 614717**




## රචනාව

ඒ යුගයේදී රාජ්‍ය සේවකයන්ගේ භාෂා ප්‍රවණතාවය පිළිබඳ ලිඛිත පරීක්ෂණයට සහභාගි වූ දමිළ මහතෙකුට බල්ලා යන මාතෘකාවෙන් යුතුව වචන පනහකින් යුත් වාක්‍ය රචනාවක් ලිවිය යුතුව තිබිණ. බල්ලා යනුවෙන් වාක්‍ය රචනය ඇරඹූ ඔහු බුරලා බුරලා....යනුවෙන් හතලිස් අට වතාවක් ලියා මළේය යන ආඛ්‍යාතයෙන් යුතුව රචනය අවසන් කර උසස් සාමාර්ථයක්ද ලද බව සමකාලීනයන් පවසන්නේ මිතුරාගේ තැනට සුදුසු නුවණ පිළිබඳ ගෞරවයෙනි.

## නඩු දැමීම

**කමිටු සභිකයා** ඃ සභාපතිතුමා මීට පස්සේ අපි පස්දෙනෙකුට වඩා කොමිටි මීටිමට එන්න හොඳ නෑ.
**සභාපතිතුමා** ඃ එහෙම කොහොමද? ඔක්කොම එන්නේ නැතිව තීන්දු තීරණ ගන්නේ කොහොමද?
**කමිටු සභිකයා** ඃ සභාපතිතුමා ඊයේ නිවුස් ඇහුවද? පොලිස් මාධ්‍ය ප්‍රකාශක කීවනේ පස් දෙනෙකුට වැඩිය රැස් වුනොත් අයුතු ඒක රාශි වීමක් කියලා නඩු දානවා කියලා.

## අලුත්ම ක්‍රීඩාව

**නිවේදකයා** මෙන්න අලුත් අවුරුද්දට හඳුන්වාදෙන ක්‍රීඩාවක්. ඒ සඳහා සහභාගී වීමට කැමති අය වේදිකාව අසල ඇති තෙමහල් ගොඩනැගිල්ලේ සිටින සංවිධායක මඩුල්ල මුනගැසෙන්න.
**නරඹන්නෙක්** ඃ මොකද්ද ඔය කියන අලුත්ම ක්‍රීඩාව
**නිවේදකයා** ඃ තට්ටු ගොඩනැගිල්ලේ සිට වීදුරුව කඩාගෙන බිමට පැනීම ඇයි? හොඳ නැද්ද?

## ගෘහස්ත ප්‍රචණ්ඩත්වය.

**1)යහලුවා** ඃ අපේ පවුල සිංදු කියන කොට මං ඉක්මනට ගේට්ටුව ළඟට යනවා.
**2 යහලුවා** ඃ ඇයි සිංදු අහන්න ගේට්ටුව කඩාගෙන එන්න හදනවාද?
**1යහලුවා** ඃ නෑ මචං මං එළියේ ඉන්නවා දැක්කම ඕන කෙනෙකුට තේරෙනවනේ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය නෙමෙයි කියලා.

## ප්ලාස්ටික් සර්ජරිය.

**පියල්** -මොකද මචං උඹ අප්සෙට් එකේ වගේ
**කමල්** -මං යාලුවෙකුට ලක්ෂ 5 ක් දුන්නා ප්ලාස්ටික් සර්ජරි එකකට
**පියල්** -ඉතිං ඌ සල්ලි ආපහු දුන්නේ නැද්ද?
**කමල්** -නෑ බං මට ඌව අඳුරගන්නත් බෑ
ඌ සල්ලි ටික ගෙනත් දුන්නෙත් නෑ

## ඇඳ යටින්

**මිතුරා 1** ඃ මොකද උඹ දාහට අරන් සීයට දීලා වගේ
**මිතුරා 2** ඃ ඊයේ ටිකක් බීලා ගෙදර ගියා. දන්නේ නැද්ද වයිෆ් බර බරේ දැම්මා. දොර ඇරියේ නෑ එළියේ නිදාගත්තා.
**මිතුරා 1** ඃ ඒ අතින් මං වාසනාවන්තයි. කොච්චර බීලා ආවත් දොර ඇරලා දනගාගෙන තමයි ඇඳ ළඟට එන්නේ.
**මිතුරා 2** ඃ අනේ මචං මටත් කියපන්කෝ ඇඳ ළඟට ඇවිත් බනිනවද?
**මිතුරා 1** ඃ නෑ බං. චන්ඩියා වරෙන් ඇඳ යටින් මං ගහන්නෑ කියනවා.

**ජගත් කාරියවසම්**

# The Flowers that God Loves

It is in the experience and practice of the citizens of Bharath that they generally worship God with flowers, offer *puja* (ritual adoration) and make obeisance to God. But there is something which is more sacred than this. There is a distinctive type of devotion by which you worship God with a good, clean mind and good conduct. This has been given the name of *Paraa bhakthi.* By worshiping God always with *puja* and flowers, the *saadhaka*(spiritual aspirant) will remain stationary in his place. This is good in a way but to remain in one place all the time and failing to rise to a higher position is not good. It is a superior type of worship---to worship God through good qualities, good conduct, good thoughts and good company. The *shruthis* (scriptures) have described this kind of worship as worship through good qualities. By offering what kind of good qualities can we please God?

The first flower with which we can worship God is *ahimsa*--- non-violance. The second flower is *dhamma*---(control of senses). The third flower is *dhaya*(compassion to all living beings). The fourth one is *kshama*(forbearance). The fifth flower is *shannthi* (peace). The sixth flower is *thapas* (penance). The seventh one is the flower of *dhyaana* (meditation). The eighth is the flower of *Sathya*(Truth). The inner meaning of this statement is that God will shower grace on you if you worship him through these eight flowers.

The flowers in nature fade always, drop down, lose fragrance and also develop an odour which is not pleasant. Instead of worshipping with such worldly flowers, which are impermanent rewards from God, we should worship Him with what is truthful and thereby attain a stage which is higher.

The flowers which you are using for worship have not been created by you. You are bringing flowers which have been created by the *sankalpa*(will) of God on some tree or in some garden and are offering them back to the Creator Himself. What is the greatness in using the flowers created by God and giving them back to God Himself? Many people bath in the Ganges, take the water from the Ganges into their palms and offer it back to the Ganges itself. This is not what you have created. This is not what you have the right to offer.

From the tree of your life, to pick out such fruits which you have protected and which you have grown in the form of good qualities and offering them to God, there is some distinctiveness in that. In order to promote good qualities, you have to undergo several troubles. So it is through these good qualities that your mind can also acquire a divine concentration. Without good qualities and without good thoughts, how can you fix your mind in meditation?



**- Leela Mohanasundaram (3173)**
**011 2360665 / 077 8378506.**

# OUR SOLAR SYSTEM (CONT) JUPITER AND VENUS

## JUPITER

Jupiter is the largest planet in solar system. Over one thousand Earth sized planets could fit in if the Jupiter is hollow. It also could contain Two and a half times of mass of rest of the planets combined. Jupiter also has 62 Moons out of which four largest are Callisto, Europe, Ganymede and Io. Galileo observed them in 1610. These are called **Galleon Moons**. Ring system of Jupiter is very faint, it's totally invisible from Earth. The Voyager 1 discovered the ring system in 1979.More reliable information could be gathered when **NAZA'S Juno space** craft reaches Jupiter and orbit around the Jupiter in first week of July 2016.

The atmosphere is very deep and consists of mainly Hydrogen and helium with small particles of methane ammonia and water vapor and other compounds. A weather system of the planet is very dynamic. Jupiter's Colorful Latitudinal bands, atmospheric clouds and storms illustrate nature of dynamic weather patterns. The c loud patterns change rapidly in Jupiter. Aurora emission, similar to Earth's northern lights. Those were observed in the polar regions of Jupiter. Laplace Resonance: of Jupiter is orbital time taken by large satellites. I.e. every four obits that *To makes around Jupiter, Europa makes exactly two orbits and Ganymede makes exactly* one around Jupiter. All these Moons are subject to heavy volcanic activity.

| | STATISTICS | |
|---|---|---|
| Mass | Earth =1 | 3-18 |
| Equatorial radius | K.M. | 71492 |
| Mean distance from the Sun | K.M. | 778,330,000 |
| do | Earth = 1 | 5.20 |
| Rotaional period | days | 0.41 |
| Orbital period | days | 4332.71 |
| Mean orbital velocity | Km/sec | 13.07 |
| Tilt of axis | degrees | 3.13 |
| Orbital inclination | degrees | 1.308 |
| Mean cloud tempreture | centigrade | -121 |
| ATMOSPHERI PREASURE | BARS | 0.7 |
| | ATMOPERIC COMPOSITION | |
| Hydrogen | percent | 90% |
| Helium | percent | 10% |

## VENUS

Venus was named after the Roman Goddess of love and beauty. Early astronomers thought Venus to be two separate bodies, because ancient astronomers called it morning and evening star. Venus is also known as jewel of the sky and sister planet of the Earth. Both planets are similar in size, mass, density and volume. However, lately scientists have found that Venus is different from Earth. Venus has no ocean and surrounded by heavy atmosphere consist mainly of carbon dioxide and virtually has no water vapor. The clouds of Venus comprised of sulfuric acid droplets. The surface temperature is as high as 482c (900F). This high temperature is because sunlight passes through the atmosphere to heat the surface,trapped by the dense atmosphere and not allowed to escape to space.

Until seventies scientist found it difficult to find the geological structure of the planet. The four missions carried out by NAZA and Soviet Union's Venera missions.

1. 1978 NAZA, S Pioneer Venus Mission.
2. 1983- Soviet Union's Venera 15 mission.
3. 1984- Soviet Union's Venera 16 Mission.
4. 1990-1994 NAZA"S Magellan radar mapping mission.

**These missions revealed.**

1. Vast plains covered by lava flows.
2. Highland regions or mountains deformed by geological activity.
3. Aphrodite Terra Highlands extend almost half way around the equator.
4. Liquid water does not exist.
5. Giant calderas more than 100 kilo meters (62 miles) in diameter found in Venus.

More recent missions carried out by European Space Agency in November 2005, and it successfully assumed polar orbit around Venus in April.2006.

| | STATISTICS | |
|---|---|---|
| Mass | Earth =1 | .814 |
| Equatorial Radius | K.M | 6051.8 |
| Mean Distance From the Sun | K.M | 108,200,000 |
| Do | Eartrh=1 | 0.7233 |
| Rotational Period | Days | -243.018 |
| Orbital Period | Days | 224.701 |
| Tilt of Axis | Degrees | 177.36 |
| Orbital Inclination | Dgrees | 3.394 |
| Mean surface Tempreature | Centigrade | 482 |
| Atmospheric Preassure | Bars | 92 |
| | ATMOSPERIC COMPOSITION | |
| Carbon Dioxide | Percent | 96% |
| Nitrogen | Percent | 3% |
| Trace elements (Sulpher Dioxide,Water Vapor etc:) | Percrnt | 1% |



Jayalal Jayawardena (826)
0112 601383 / 0777 412289.

## දයාබර ඉල්ලීමක්

**"නුඹ තවමත් සුවඳ මලකි"** පද්‍ය සංග්‍රහයක් ඔබ තවමත් මිලදී ගෙන නැත්නම් කඩවත, නුවර පාරේ, අංක 67 යන ලිපිනය සහිත ස්ථානයෙන් හෝ දුරකථන අංක 0112 926374 ට කථා කොට ලබා ගැනීමට කාරුණික වන්න. ස්තූතියි !



**සුවඳමල් බුරුත්තක
සැගවෙන්න එපා ඔබ
ඔබ මගේ සුවඳ මල
සිපගන්න බැහැ එවිට**

# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමය

364/A, ජිනසේන මාවත, මහර, කඩවත
දුරකතන අංක 0112-901891/071-8026411

## එක්දින සාමූහික චාරිකාව - 2016

**ශ්‍රී** ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමය මෙහෙය වන එක් දින සාමූහික චාරිකාව, මෙවර පාදුක්ක, බෝපේ සෙරනිටි විලේජ් හෝටලයට යාම සඳහා සියලු කටයුතු සූදානම් කරමින් පවතී.

ගමනේ විස්තර පහත දැක්වේ. සහභාගි වන සංඛ්‍යාව 100 කට සීමා වන හෙයින්, පලමුව මුදල් ගෙවූ අයට පලමු තැන හිමි වේ.

1. **පිටත් වන දිනය** - 2016-08-20 (සෙනසුරාදා)
2. **ගමන්මාර්ගය හා වේලාව** -

**බස් රථ අංක 01 :**

- **ආරම්භය උදෑසන 06.30 ට යක්කල චන්ද්‍රජෝති විදුහල අසලින්.**
- ඉන්පසු පිළිවෙලින් බැලුම්මහර හන්දිය පෙ.ව. 06.40 ට
- කඩවත පොලිස් ස්ථානය අසලින් පෙ.ව. 06.45 ට
- කිරිබත්ගොඩ හන්දිය (අමිල කේටරස් අසලින්) පෙ.ව. 07.00 ට
- පෑලියගොඩ (හතරේ කණුව අසලින්) පෙ.ව.07.15 ට
- බොරැල්ල (YMBA ඉදිරිපිට ) පෙ.ව.07.15 ට
- නාරාහේන්පිට හරහා කිරුළපන - (ක්‍රීඩාංගනය ඉදිරිපිට) පෙ.ව. 08.00.
- නුගේගොඩ (පීසා හට් අසලින්) පෙ.ව. 08.10 ට
- විජේරාම හන්දිය පෙ.ව. 08.20 ට
- මහරගම (ලාෆ් ගෑස් වෙළෙඳහල අසලින්) පෙ.ව. 08.30 ට
- මොරකැටිය හන්දිය ළඟ - 08.40 ට
- කොට්ටාව (කාගිල්ස් අසලින් ) පෙ.ව. 08.50 ට)
- හෝමාගම ගලවිලවත්ත (උපාලි සමූහ ව්‍යාපාර ආයතනය අසලින්) පෙ.ව. 09.05 ට
- හෝමාගම (සම්පත් බැංකුව ඉදිරිපිට) පෙ.ව. 09.15 ට
- ගොඩගම හන්දිය ළඟින් - පෙ.ව. 09.30 ට
- මීපේ හරහා, මීපේ හන්දිය, බෝපේ සෙරන්ටි විලේජ් හෝටලය - පෙ.ව.10.00 ට

**බස් රථ අංක 02 :**

- **ආරම්භය උදෑසන 07.00 ට බම්බලපිටිය වෑගොඩපොල නිවස්නය අසලින්.**
- ඉන් පසු පිළිවෙලින් වැල්ලවත්ත මාර්කට් අසලින් පෙ.ව. 07.15 ට
- දෙහිවල ඊබට් සිල්වා පිරවුම් හළ අසලින් පෙ.ව.07.30. ට
- ගල්කිස්ස පොලිස් ස්ථානය අසලින් පෙ.ව. 07.40 ට
- රත්මලාන මැලිබන් හන්දිය අසලින් පෙ.ව. 07.50 ට
- කටුබැද්ද ජර්මන් ටෙක් අසලින් පෙ.ව. 8.00 ට
- මොරටුව (YMBA) අසලින් පෙ.ව. 08.15 ට
- පානදුර පොලිස් ස්ථානය ඉදිරිපිට පෙ.ව. 8.30 ට
- පානදුර, හොරණ පාර හරහා, බණ්ඩාරගම, හොරණ, සෙරනිටි විලේජ් හෝටලය පෙ.ව. 10.00 ට

3) **එදින උදය ආහාරය ඔබ විසින් සපයා ගත යුතුය.**

4) **අය කිරීම**- සාමාජිකයා හා පවුලේ සාමාජිකයන්ගෙන් (එක් අයෙකුට) - **රු.2000/-**

මුදල් ගෙවිය හැකි ක්‍රම

1) චෙක් පතක් නම් ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය නමට රේඛනය කර එවන්න.

2) HNB බැංකුවේ අංක 002010016134 ගිණුමට බැර කොට රිසිට් පතේ පිටපත එවන්න.

5) මීට යාකොට ඇති කූපනය නිසිලෙස පුරවා මුදල් ගෙවා ඇති ක්‍රමය සඳහන් කොට **2016-08-10 වෙනි දිනට පෙර** ගරු භාණ්ඩාගාරික ආර්.ඩී. ගුණසේන, 364/A,ජිනසේන මාවත, මහර, කඩවත යන ලිපිනයට ලැබෙන්නට සලස්වන්න.

**විමසීම් සඳහා දුරකතන අංක**

| | | | |
|---|---|---|---|
| ආර්.ඩී. ගුණසේන | - 0112901891/0718026411 | අමරපාල කරසිංහ ආරච්චි | - 0382234226/0785863155 |
| ජගත් කාරියවසම් | - 0382236643/0779507184 | ජයලාල් ජයවර්ධන | - 0112601383/0777412289 |

ගරු භාණ්ඩාගාරික.
ආර්.ඩී.ගුණසේන මහතා,
364/A, ජිනසේන මාවත, මහර, කඩවත.

දුරකතන අංක ඃ 0112-901891/071-8026411

නම ඃ ..............................................................................................................................

විශ්‍රාම අංකය ඃ ................................................................................................................

දුරකතන අංකය ඃ .......................................      ජංගම දුරකතන අංකය ඃ.........................................

සහභාගි වන සංඛ්‍යාව ඃ.......................................................................................................

ගෙවූ මුදල ඃ .........................................................................................................................

මුදල් ගෙවූ පිලිවෙල ඃ (1) භාණ්ඩාගාරිකට මුදලින් ගෙවීමෙන්

(2) චෙක් පතක් එවීමෙන්      අංකය..........................      බැංකුව........................

(3) HNB බැංකුවට මුදල් බැර කොට රිසිට් පත එවීමෙන්

..............................................      .....................................
අත්සන      දිනය

## පාසැල් දරුවන් උදෙසා

**එ**කමත් එක වකවානුවක අපේ වැඩිහිටියනුත්, අපත් අත් විඳිනු ලැබූ සොබාදහමේ තුලනාත්මක බව ක්‍රමානුකූලව අවසන් ගමන් යමින් සිටී. ජනගහනය වැඩිවීමත්, වැඩිවන ජනගහනයට අවශ්‍ය ආහාර පාන, ඉඳුම් හිටුම්, ඇඳුම් පැළඳුම්, විවිධ පාරිභෝගික භාණ්ඩ මෙන්ම ජීවිත්වීම සඳහා සුදුසු රැකීරක්ෂා හා නිෂ්පාදන කර්මාන්ත වෙනුවෙන් අති දැවැන්ත කුළුගෙඩි පහර වදින්නේ සොබාදහමේ උත්තරීතර අංග ප්‍රත්‍යංග වලටයි, විශේෂයෙන්ම ජලගෝලය, වායුගෝලය හා ප්‍රාංශු ගෝලය ලහි ලහියේ වර්තමානිකයන් විසින් පාලනයකින් තොරව පරිභෝජනය කිරීමත්, ලාභාංශය විශාල කර ගැනීමත් නිසා අතීතයේ පැවති සොබා දහමේ දයාබර බව වැනසී යයි. සොබාදහමේ තුලනාත්මක බව අහෝසි වෙමින් යයි.

එහි සෘජු ප්‍රතිඵලයක් වශයෙන් පෙර නොවූ විරූ සුළි සුළං, නියං උවදුරු, නායයෑම්, ලැව්ගිනි, භූ කම්පන හා ගංවතුර උවදුරු එක පිට එක බැගින් ලඟා වේ. ටික කලකට පෙර ලෝකයේ ප්‍රධාන රටවල් රාශියකටද මෙබඳු උවදුරු පොකුරු පිටින් උදා වූ බව ලෝකයටම රහසක් නොවේ.

එමෙන්ම නොබෝදා ශ්‍රී ලංකාවට ද උදා වූයේ සුළුපටු ව්‍යසනයනයන් නොවේ. ගංවතුර උවදුරු ඉන් එකක් පමණි. එමගින් උන්හිටි තැන් ජලයෙන් යටවී අසරණ වූවෝ බොහෝය. එසේ අසරණ වූවන්ට ශක්ති පමණින් පිහිට වූවෝ ද බොහෝය.

එම අවස්ථාවේ අප විශ්‍රාමික සංගමයේ සාමාජික සාමාජිකාවන් පිරිසකගේ දායකත්වයෙන් අසරණ වූ පාසැල් දරු දැරියන් උදෙසා නොබෝදා පොත්පත් හා ලිපි ද්‍රව්‍ය ප්‍රමාණයක් පරිත්‍යාග කරන ලදී. එය **කඩවත බිම්බාරාමයේ** දී සිදු කෙරුන අතර ඊට සංගමයේ ගරු ලේකම් එච්.එම් පී.හේරත් **ගරු භාණ්ඩාගාරික ආර්.ඩී.ගුණසේන හා කමිටු සභික එල්.එම්.ඩී. කබ්රාල්** යන මහත්වරු සහභාගී වූහ. කරුණාව යනු 'අනුන්ගේ දුකක් දුටු කල්හි කම්පාවට පත්වන සත් පුරුෂයන්ගේ හදවතේ ස්වභාවය'යි යනුවෙන් විශුද්ධි මාර්ගයේ ද දැක්වේ.

(22 වැනි පිටුවට)

Hon: Treasure
Mr. R.D. Gunasena,
364/A, Jinasena Mawatha,
Mahara, Kadawatha.

Telephone No : 0112-901891/071-8026411

Name :.....................................................................................................................................

Pension No : ......................................................................................................................

Telephone No : ........................................ Mobile phone No :...............................................

Number of Persons Joining the trip :.........................................................................................

Amount Paid : ......................................................................................................................

Tick Method of Payment adopted : 1. In cash to the treasurer

2. By a Cheque No...................... Bank .........................

3. Credited to HNB and send receipt

............................................... ......................................

Signature Date

(21 වැනි පිටුවෙන්..)

**පාසැල් දරු දැරියන් උදෙසා පාසැල් උපකරණ පරිත්‍යාග කෙරෙන අවස්ථාවේදී.........**







# Central Bank Pensioners' Association


## 364 A, Jinasena Mawatha, Mahara, kadawatha.

Tel : 0112-901891/071-8026411


## One day trip - 2016

The One day trip to be conducted by Central Bank Pensioner's Association in organized.
The details of the trip are as follows.

1. **Setting off on 20/08/2016 (Saturday)**
2. **Startiong point and time.**

**Bus no 01:**

**Starting from yakkala (near chandrajothi vidyalaya at 6.30 a.m)**
Balummahara junction at 06.40,
Kadawatha (near The Police Station) at 06.45 a.m
Kiribathgoda Junction (near Amila Cateres) at 07.00 am.
Peliyagoda (near No.04 mile post) at 07.15 am.
Borella (YMBA) 07.45 am.
Narahenpita - across Kirulapona (near Playground) at 08.00am.
Nugegoda (near pitza hut) at 08.10 am.
Wijerama junction at 08.20 am
Maharagama (near Laugh gas ) at 8.30 am.
Morakatiya junction at 08.40 am.
Kottawa (near cargills) 08.50 am.
Homagama - Galawilawatta (near upali Company) 09.05 am.
Homagama ( In Front of Sampath Bank) at 09.15 am.
Godagama Junction at 09.30 am.
Meepe (across meepe junction, bope Seranity Village Hotel) at 10.00 am.

**Bus No 02 :**

**Starting form Bambalapitiya (near wegodapola residence ) at 07.00 am.**
Wellawtta (near police station ) at 07.40 am.
Dehiwala (near Ebert Silva Filling station) at 07.30 am.
Mt. lavinia police station at 07.40 am.
Ratmalana (near Maliban Junction ) at 07.50 am.
Katubedda (German tec )at 08.00 a.m
Moratuwa (near YMBA) at 08.15 am.
Panadura (Front of police Station ) at 08.30 am.
Panadura - Horana Road (Across Bandaragama, Horana, Seranity Village-Hotel ) at 10.00 am.

3. **Participants will have to supply themselves with their own Breakfast.**
4. **Charges and Payments** Rs.2000/- per head from members and those of their families.

**Payments to be made by**

1) Cheques written in the name central Bank Pensioners Association and crossed.
2) Credit to A/C No 002010016134 at Hatton National Bank and Send a **Copy** of the receipt of payment.

**5.** With emphasy we say that only those who pay will have the chance of going, as only 100 persons can go on the trip. Please return the coupon attached filled, stating the mode of payment, **before 10.08.2016,** to the treasurer R.D. Gunasena of address 364/A, Jinasena Mawatha, Mahara, Kadawatha.

**Phone Numbers to inquire :**
R.D.Gunasena -0112901891/0718026411 Mr.A.Karasinghe Arachchi -0382234226/0785863155
Jagath Kariyawasam -0382236643/0779507184 Mr. Jayalal Jayawardhana - 0112-601383

# දැනුම් දීමයි

**සංගමයේ 2016 එක්දින චාරිකාවේ සියළුම විස්තර සඳහා අංක 20, 21, 22 හා 23ඇතුළු පිටු කියවා බලා ඉක්මනින්ම ගරු භාණ්ඩාගාරික වෙත දැනුම් දෙන්නේ නම් අතිශයින්ම කෘතඥ වෙමු.**

**විධායක කමිටුව**


# සැඳෑව
සந்தாவ

ශ්‍රී ලංකා
මහ බැංකු විශ්‍රාමිකයන්ගේ
සංගමය
2016 ජුනි/ අගෝස්තු.



වෙබ් අඩවිය ඃ www.sendewa.org විද්‍යුත් ලිපිනය info@cbpa.com
අංක ඃ QD/83/News/2016 යටතේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදී.



ගරු ලේකම්,
මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය,
116/2/1B, බෝ සමිඳු මාවත, දොලේකනත්ත,
මහරගම පාර, පිළියන්දල.



රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරණ ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව
ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමිකයින්ගේ සංගමය විසින් නිකුත් කරන ලදී.

සැඳෑව - සංස්කරණය
අමරපාල කරසිංහ ආරච්චි විසිනි.

Typesetting - **Graphicworld** - Panadura.
graphicworld.pan@yahoo.com
graphicworldit@gmail.com